# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.09.24

වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 24 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
14. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
15. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
16. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
17. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
04. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
05. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අද විශේෂ සභාව කැඳවන්න කියලා ගිය මහා සභාවේදී තීරණය වුණා. ඒ අනුව තමයි අද විශේෂ සභාව කැඳවන්නේ. ඉතිං ඒකෙදී වෙනත් බාහිර කරුණු නැතුව අදාළ කාරණා විතරක් කතා කරමු. අද ඇත්තටම කැඳෙව්වේ වෙන්දේසි ඉඩම් ගැන කතා කරන්න.

එදා අපිට දීර්ඝ කාලයක් ගත වෙනවා ඒවා කතා කරන්න ගියොත්තින්. න්‍යාය පත්‍රය එදා දිගට තිබුණා. ඒක හින්දා තමයි අද කැඳෙව්වේ. මම ඉල්ලා සිටිනවා අදාළ කරුණු ගැන විතරක් අද සාකච්ඡා කරමු කියලා. කොහොමත් නෛතිකවම ඒ කාරණා විතරයි අද කතා කරන්න පුළුවන්. බාහිර කරුණු ඉදිරි මහා සභා රැස්වීමේදී කතා කරමු.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.** **ඃ- නැත.**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා ඃ- නැත**

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ- නැත.**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ- නැත.**

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. වෙන්දේසි ඉඩම් විෂය ක්ෂේත්‍රයේ මතු වී ඇති ගැටළු සාකච්ඡාව හා තීරණ ගැනීම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, අර ජස්ටින්කන්දේ සන්ටෙල් ආයතනය කුළුණක් හැදුවා. දැන් ඒක ඩයලොග් සමාගම සතුව තියෙන්නේ. පහුගිය දවස් ටිකේම ඒ අවට භූමිවලට ඇතුල් වෙලා ඒ භූමිය කැනීම් කරලා තියෙනවා. ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත්, ප්‍රාදේශීය සභාවත් මම හිතන්නේ දැනුවත් කරලා ඇති. අපි තාක්ෂණ නිලධාරීන්ගෙන් වාර්තාවක් අරගෙන ඒක කරමු. ඊට අමතරව මම පහුගිය සභාවල ඉල්ලීමකුත් කරා. දැන් සන්ටෙල් සමාගමටනේ අපි මේ කුළුණ සඳහා අවසර ලබා දීලා තියෙන්නේ. ඒ අතරමැදි කාලය තුළ ඒක ඩයලොග් සමාගමට විකුණලා කියලා ආරංචියකුත් තියෙනවා. ඒ වුණත් දැන් ආයතන කිහිපයක්ම ඒකේ සවිකරලා තියෙනවා.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සම්ප්‍රේෂණ කුළුණකට රුපියල් තුන්දාහයි අය කරන්න පුළුවන්. ඒක මොන ආයතනය වුණත් එච්චරයි. අපිට ඊට වැඩි මුදලක් ගන්න ක්‍රමයක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි දීලා තියෙන්නේ ඩයලොග් සමාගමට. නමුත් ආයතන කිහිපයක්ම සවි කරලා තියෙනවා, අතුරු බදු දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ගෙවන්නේ කුළුණට. කුළුණට අයකරන මුදල තමයි අපිට අය කරන්න පුලුවන්. ඔබතුමා කියන එක හරි. අපිට ඒක අතුරු ව්‍යවස්ථාවකින් කරන්න බැරි වෙන එකක් නැහැ. ඒකට උපදෙස් ගන්න. ඒක අතුරු ව්‍යවස්ථාවකින් කර ගන්න බලමු. ඒක හොඳ යෝජනාවක් ඇත්තටම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ මාර්ගයේ අධිබර වාහන ගමන් කරලා මාර්ගයට වෙන හානිය ඊට වැඩියි. ඉදිරි දිනයකදී මම හිතන්නේ එතන පහළ තියෙන ඉඩමකට කඩා ගෙන වැටෙන මට්ටමට වාහන ගමන් කරනවා. ඒක හින්දා මේ අයගෙන් බදු ගන්න බැරිනම් පාර හදාගන්න. මට මතකයි රිචඩ් පතිරණ මැතිතුමා ඉන්න වෙලාවේ ඔය පාර සම්පූර්ණයෙන්ම හැදෙව්වේ ඔය සමාගමට කියලා පාරට හානි වෙලා තියෙන නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි බර සීමාවක් පනවමු එහෙමනම්. එතකොට කාටත් ඒක බලපානවා හැබැයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බර සීමාව පනවලා ඉවර වෙලා පාරේ නඩත්තුව බාර දෙමු නැවත වතාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඉල්ලීමක් කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** බර සීමාවකුත් පැනෙව්වොත් බැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ වුණත් කමක් නැහැ. ඒ අනතුරුදායකබව ඉවත් වෙනවානේ. මාර්ගයේ ඉතුරු ටික හදා ගන්න බලමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදාළ ආයතනයෙන් අපි ඉල්ලීමක් කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕක ඊට කලිනුත් කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට බර සීමා පනවන්න වෙනවා. ඒ නිසා මේක හදලා දෙන්න කියලා ඉල්ලීමක් කරමු. ඒකට විධිමත් යෝජනාවක් ගේන්න මන්ත්‍රීතුමා ලබන සභාවට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මීට කලින් ගෙනාවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ විදියට විධිමත්ව ගේන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේ සභාවට ගිය සභාව වෙලාවේදී තමයි දිනය වෙන්කර ගත්තේ. කෝ තාක්ෂණ නිලධාරීන්. කෝ දිනූෂ මහත්මයා. මේ අනවසර ඉදිකිරීම් ගැන කතා කරන කොට කෝ තාක්ෂණ නිලධාරීන්. තවත් අර්ජුන මහේන්ද්‍රන් කෙනෙක් තමයි මේ සභාවේ ඉන්න තාක්ෂණ නිලධාරි දිනූෂ මහත්තයා. කරුණාකරලා තාක්ෂණ නිලධාරීන්ව ගෙන්වන්න මෙතනට. මේ කාරණා කතා කරන කොට අපිට විස්තර දැන ගන්න ඕන. මේක ක්ෂණිකව කරපු දෙයක් නෙමෙයිනේ. තාක්ෂණ නිලධාරීව කරුණාකරලා ගෙන්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එන ගමන් ඉන්නේ.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කුළුණු පිළිබඳව අපි යෝජනාවක් ගේමු. සාමූහිකව විධිමත් යෝජනාවක් ගේමු. ඒ වගේමයි මේකේ කුළුණු වෙනුවෙන් ගන්න ඕන එකක් තියෙනවා. ඒ තමයි බද්දෙන් බද්ද ගන්න දෙන්න බැහැ. ඒ අය අපිට තුන්දාහක් ගෙවලා අනිත් හැම කොම්පැනි එකකින්ම ලක්ෂ ගාණක් හම්බ කරනවා. ඉතිං ඒකනේ ඇත්තටම වෙන්නේ. එහෙම දීම තහනම්. ඉතිං අපි අතුරු ව්‍යවස්ථාවක් හදමු උපදෙස් අරගෙන.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ කරුණු වලට යමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අද ඇත්තටම අපි විශේෂ සභාවක් පවත්වන්න හේතුව තමයි වෙන්දේසි ඉඩම්. මම හිතන්නේ දැන් මේ වෙන්දේසි ඉඩම් කරන කොට තියෙන විනාශයත් එක්ක, තියෙන ප්‍රශ්න කතා කරන්න තමයි අද විශේෂ සභාව කැඳෙව්වේ. ඉතිං මම හිතන්නේ මේක පොදුවේ පක්ෂ භේදයකින් තොරව අප සියලු දෙනාගේම යුතුකමක් මේ පිළිබඳව නිවැරදි තීන්දු වලට ඇවිල්ලා අවශ්‍ය කටයුතු කිරීම. මේ නිසා ඒකට හේතුව තියෙන්නේ වෙන කිසිම දෙයක් නෙමෙයි. මේ අරගලය ගරු සභාපතිතුමා ඇතුළු අපි අවුරුදු දහයක් විතර තිස්සේ ගෙනිහිල්ලා තියෙනවා. හැබැයි බොහොම පැහැදිළි නිර්දේශ දීලා තියෙනවා. ඉතිං මේවා කඩකරමින් තමයි යන්නේ. දැන් අපි ඇවිල්ලා තියෙන්නේ අග්ගිස්සට. දැන් අපිට පේනවා වෙච්ච විනාශ මොනවද කියලා. ඒ කියන්නේ නුවර සිද්ධිය, එතකොට වැල්ලවත්තේ සිද්ධිය, ඉතිං මෙහේම උළුවිටිකේ වෙච්ච සිද්ධිය. මේවා ගත්තම ඇත්තටම මේ පළවෙනි වැරැද්ද කරන්නේ අපි නෙමෙයි. මම දිගින් දිගටම කියන්නේ ඔබතුමන්ලා අපි මේකෙන් නිදහස්. අපිට සමහර වෙලාවට මහජන නියෝජිතයෝ විදියට ඇවිල්ලා යම් යම් බලපෑම් කරන්න පුළුවන්. නමුත් මූලික තැනින් ඒ කියන්නේ විශේෂයෙන්ම පතල් හා භූ විද්‍යා එකෙන්, එන්.බී.ආර්.ඕ. එකෙන් යන ආයතන වල අය නිවැරදි තැනක ඉන්නවා නම් හරි. ඒ අය නිවැරදි තැනක කොයි වෙලාවකවත් හිටියේ නැහැ. මම ඒකට බොහොම සාක්ෂි ඇතුව ඔබතුමන්ලාට කියන්නම්. ඒ අය හරියට කෙලින් ඉන්නවා නම් මේ කිසිම දෙයක් වෙන්නේ නැහැ. එතකොට පරිසර අධිකාරිය නිවැරදි තැනක ඇත්තේ නැහැ. දැන් ගරු සභාපතිතුමා ඔබතුමන්ලා අපි උදාහරණයක් කිවුවොත් එහෙම මේකේ තියෙන අවදානම් සහගත ස්ථාන තුනක් විදියට නම් කරලා තියෙනවා කුරුන්ද කන්ද, රොස්වුඩ් එක. ඊළඟට මවුන්ට්ප්ලසන්ට් එක. මවුන්ට්ප්ලසන්ට් එකේ ඔබතුමාට මතක ඇති දැන් අවුරුදු හත අටකට උඩදී එක්තරා වෙලාවක නාය ගියා. නාය යනකොට ඒ කට්ටිය මොකක්ද කරේ. එතනින් උඩට ඇවිල්ලා ආරක්ෂිත තැන්වල පොඩි මේවා එකක් ගහගෙන හිටියා වරුසාවේම. ඊට පස්සේ ඉතිං එදා ඉඳපු බලධාරීන්ගෙන් ඒකට හරි මේවා එකක් හම්බ වුණේ නැහැ. නැවත අනතුරට ගියා. ඔබතුමන්ලා අපි ගිහිල්ලා ඒකට මැදිහත් වුණා. ඉතිං ඇත්තටම අනතුරක තමයි මේ මිනිස්සු ඉන්නේ. දැන් මේ අනතුරු තියෙන තැන් වල තමයි බොහොම පැහැදිළිවම මේ අය නිවාස හදන්න අනුමැතිය දීලා තියෙන්නේ. අපි සංවර්ධන කමිටු වලට ගියාට ඒවායේදී අපි ප්‍රශ්න අහන කොට එන්.බී.ආර්.ඕ. රිපෝට් එක අරගෙන තියෙනවද ඇහුවම එන්.බී.ආර්.ඕ. එකේ එක්කෙනා නැගිටලා ඔව් කියනවා. හැබැයි මේ මන්ත්‍රීවරු කවුරුවත් දන්නේ නැහැ මොකක්ද රිපෝට් එක කියලා. මේ අය දෙනවා

මධ්‍ය අවදානම් කියලා. මේ අය කැල්ලෙන් කැල්ල ඇවිත් බලන්නේ නැහැනේ. බටුවන්තුඩාවේ කාලය පිළිබඳ ප්‍රශ්නය විතරයි ඉතුරු වෙන්නේ. කොයි වෙලාවක හරි යනවා. මොකක්ද හේතුව මේකේ පොඩි එක තමයි සිද්ධ වුණේ උළුවිටිකේ. ලොකු එක ඉතාම ඉක්මනින් බටුවන්තුඩාවේ පන්සල ඉස්සරහ සිද්ධ වෙනවා. මිනිස්සුන්ට හානියක් නොවී ඒක දැන්ම වෙනවා නම් හරි.

දැන් බලන්න ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා අවධානය යොමු කරන්න. මේ ඇක්සස් ඉඩම අපි උදාහරණයකට ගමු. පහුගිය දවස්වල අපි මන්ත්‍රීවරු විදියට මම, සුගත් මන්ත්‍රීතුමා, ලියනගේ මන්ත්‍රීතුමා එහෙම ගියා ඔබතුමාව දැනුවත් කරලා. දැන් බලන්න මේ ඉඩම ගන්නකොට සාකච්ඡාවල් ගණනාවක් ඇති වුණා. ඒ ඇතිවෙච්ච සාකච්ඡාවල් වලදී ඇවිල්ලා මේ ඉන්න මිනිස්සුන්ට, එන පුද්ගලයොන්ට ඕනම යෝජනාවක් කරන්න කියලා කිව්වා. නමුත් මේක දෙන්න පුලුවන් ඉඩමක්ද, නැද්ද කියන එක පැහැදිළිව ගන්න ඕන තැන් තමයි එන්.බී.ආර්.ඕ. එක, පරිසර අධිකාරිය. එතකොට බලන්න දීලා තියෙනවා බොහොම පැහැදිළිව. ඇක්සස් ආයතනය, රොස්වුඩ් වත්තේ කරපු ඉඩම් වෙන්දේසිය පිළිබඳව දීපු වාර්තාවේ බොහොම පැහැදිළිව දීලා තියෙනවා පස් කැපීම හා ගොඩනැගිලි ඉදිකිරීම් යන සංවර්ධන කටයුතු සිදු කළ හොත් එම බිම් කොටස මෙම පැතිබෑම්ම, පිවිසුම් මාර්ගය සමග අස්ථාවර විය හැකි බැවින්, එම බිම් කොටසේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා යෝග්‍ය නොවේ කියලා. බොහොම පැහැදිළිව දීලා තියෙනවා. ඊළඟට ඒවා බොහොම පැහැදිළිව දීලා තියෙනවා A කියන කොටස ගැන. ඒක මොන ආකාරයකින්වත් වෙන්දේසි කිරීම සඳහා හෝ නේවාසික පහසුකම් සඳහා හෝ නුසුදුසුයි කියලා තියෙනවා. ඒ නුසුදුසු වෙච්ච බිම් කොටස ඊට පස්සේ සුදුසු වුණේ කොහොමද කියන එකයි ප්‍රශ්නය. ඉතිං ඒ නිසා දැන් මේකේදී අපි වාද විවාද ඇති කර ගෙන ඉන්න සභාපතිවරුත් එක්ක ඇරගන්නවා. ඉන්න මන්ත්‍රීවරු එක්ක ඇර ගන්නවා. ඔන්න ඕක තමයි සිද්ධ වුණේ. දැන් අපි ඇවිල්ලා තියෙනවා බොහොම තීරණාත්මක තැනකට. කාටවත් ඇඟිල්ල දික් කර කර ඉන්නවා නෙමෙයි. අපි බොහොම පැහැදිළිව ඔබතුමන්ලාට එකක් කියන්නම්. මෙන්න එන්.බී.ආර්.ඕ. එක දීපු සහතිකය. "ඇමුණුම් 01. A හි දක්වා ඇති බිම් ප්‍රදේශය තුල සිදු කර ඇති අක්‍රමවත් සංවර්ධන කටයුතු නිසා බෑවුම් ස්ථායිතාවයට දැඩි බලපෑම් සිදු වී ඇති අතර, එම බෑවුම් අස්ථාවර වීමේ අවධානම පවතී. පදිංචියට නුසුදුසු බව නිර්දේශ කරමි."

ඒ කියන්නේ පදිංචියට නුසුදුසුයි. දැන් පදිංචි වෙලා. දැන් ඊළඟට ගරු සභාපතිතුමනි දීපු කිසිම කොන්දේසියක් ඒ අය ඉෂ්ඨ කරලා නැහැ. ඊළඟට මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වුවා. ඔබතුමාගේ, මගේ හිටපු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ, හිටපු මන්ත්‍රී කුලරත්න මැතිතුමාගේ, ඒ වගේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අනුව පරීක්ෂණයක් පැවැත්වුවා. පරීක්ෂණයක් පවත්වලා බොහොම පැහැදිළිව කිව්වා පොදු පහසුකම් සඳහා දීලා තියෙන බිම් කොටස කිසිම විදියකින් සුදුසු නැහැ කියලා. නමුත් ඒවා මොන ක්‍රමයකටවත් ගනන් ගත්තේ නැහැ. එහෙම තමයි ඒක කරලා තියෙන්නේ.

ඔබතුමන්ලාගේ අවධානය ඊළඟට යොමු කරනවා වතුර ටැංකිය පාරට. ඒක කවුරුත් දන්නවා. ඒකට මේ සභාවේ කිසිම සම්බන්ධයක් නැහැ. ඒකේ ෆයිල් එකේ තියෙන තොරතුරු ටික ගෙන්වා ගන්න කොච්චර මහන්සි වුණාද කියන එක දන්නේ මම.

(ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔහොම කියනවට වඩා මෙහෙම නරකද, දැන් අපි කමිටුවක් පත් කරානේ. මට කමිටුවෙන් හදලා දෙන්න බැරිද මේ මේ ඉඩමේ තියෙන ප්‍රශ්න ටික. අපි හිතමු ඔබතුමා දැන් හැමදාම කියන එකක් තමයි වතුර ටැංකිය පහළ ඉඩම. ඒකේ තියෙන අඩුපාඩු ටික, ඒක දීමේ අඩුපාඩු ටික, එන්.බී.ආර්.ඕ. රිපෝට් එකේ තියෙන අඩුපාඩු ටික හදලා දෙන්න. ඇක්සස් එකේ අපි හොඳටම දන්න කාරණයක් තමයි අක්කර 04 ක් අයින් කරන්න කියපු එක. ඒක එක කාරණාවක්.

දෙවැනි කාරණාව අතන කාණුව දාන්න කිවුවේ ෆිනෑන්ස් එකේ අයටනේ. කාණුව දැම්මේ වෙනත් අයනේ. ඔන්න ඔය වගේ මතුවෙච්ච ගැටළු ටිකක් තියෙනවානේ. ඕන නම් හෙට දෙකේ ඉඳන් අවශ්‍ය කමිටුවේ ඉන්න කිහිප දෙනා එන්න. අපිට බැරිද ඒක ඉඩමෙන් ඉඩමට ගිහිල්ලා බලන්න ඔය ටික. බලලා අපි ඒක නීතියක් විදියට හදාගමු. මෙන්න මේ ඉඩමේ තියෙන අඩුපාඩුව මේක. මේකට අපි ගතයුතු ක්‍රියාමාර්ගය මොකක්ද කියලා බලමු. ඔබතුමා හැමදාම සභාවේ ඔය ටික කියනවා. ඒකට එතනින් පස්සේ කමිටුවකුත් පත් වෙනවා. කමිටුවෙන් කෙරෙන දේ අඩුයි. ඊට පස්සේ හැමදාම විශේෂ සභා කැඳව කැඳවා ඉන්න ඕන නැහැනේ. ඒක දැන් තියෙන්නේ සීමිත ඉඩම් කිහිපයකනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඇත්තටම අපි මේක කැඳෙව්වොත් ඒ ස්ථානවල පරීක්ෂණයක් කරන්න යන්න ඕන. මොකද හේතුව අපි කමිටුව දැම්මේ ඒකටනේ. මේක දැන් හරියට ගෙම්බෝ එකතු කරනවා වගේ වැඩක් තියෙන්නේ. බයිසිකලයෙන් ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි හෙට දෙකේ ඉඳන් යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට දෙකේ ඉඳන් යන්න. ගිහින් ඔය තියෙන ප්‍රධාන ඒවා බලන්න. ඔක්කොම නැතත් හතරකට හරි පහකට හරි යමුකෝ. ඔබතුමා කියන්න යන්න ඕන මේ ටික කියලා. අපි ඒ ටිකේ ගිහිල්ලා අඩුපාඩු ටික බලමු. ඇක්සස් එකේ ප්‍රශ්නය තියෙනවා. ප්‍රශ්න තියෙන ඒවා ලියාගෙන එන්න. ගන්න පුලුවන් ක්‍රියාමාර්ග ගමු. හැබැයි මේක දැනගන්න ඕන ඔක්කොම. දැන් අපිට අනිත් ආයතන එක්ක බරපතල විදියට හැප්පිලා යන්නත් බෑ මේකෙදී. මොකද දන්නවද එහෙම ඒවත් තියෙනවා. අපිට නිශ්චිත වශයෙන්ම මේක ඉලක්ක කරලම කියන්න ඕන. ඒක අපි ලියකියවිලි, අපේ තියෙන තොරතුරුත් එක්ක, ඒ අය එකඟ වෙච්ච ඒවත් එක්ක, අවසර දීමේදී වෙච්ච ඒවත් තියෙනවා. ඇක්සස් එකේ ඉඩමේ මෙහෙන් වෙච්ච ඒවා තියෙනවානේ. ඒ අය එකඟතාවයකට ඇවිල්ලා තියෙනවා අක්කර හතරක් වන වගාවට අයින් කරනවා කියලා. ඒක ආපු එක කොන්දේසියක්. නමුත් ෆිනෑන්ස් එක වෙද්දි අක්කර හතරත් ෆිනෑන්ස් වෙලා තියෙනවා. එතන තනිකරම තියෙන්නේ මංකොල්ලයක්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ යූ.ඩී. ක්ලියරන්ස් දෙනවානේ මේ මේ ආයතන වලින් ගන්න කියලා. යූ. ඩී. එක 2018.10.26 වන දින ලිපියක් එවනවා තොරතුරු පනතින් විස්තර ඉල්ලුවම. "මධ්‍යම පරිසර අධිකාරියෙන් නිර්දේශ ලබා ගන්නා ලෙස මූලික සැලසුම් නිරාකරණය ලබා දී නොමැති බැවින් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගෙන නොමැත.". මේ එකම ඉඩම. මෙහෙම මෙහෙම තියෙන්නේ, ඔක්කොම කන්ද. එකම කන්දේ එක කෑල්ලක තමයි ඇක්සස් එක කරේ. අනෙක් එක තමයි මේ අය කරේ. එතකොට ඒක නැති හන්දා මෙහෙම කියනවා. " මූලික සැලසුම් නිරාකරණය ලබා දීමේදී ඉඩමේ පහළ කොටස කුඹුරු ඉඩමක් හෝ වගුරු බිමක් ලෙස සඳහන් කර නොමැති බැවින් පහත් බිම් ගොඩකිරීමේ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට දක්වා නොමැත. " ඒ කියන්නේ භූමියට ඇවිල්ලා නෙමෙයි දෙන්නේ. එතකොට ඊළඟට මේක නිසා මම මේ දරන මතයක් ඔබතුමා කියපු එක හරි. අපි ඒක හෙට කරමු. ඒ වගේම අපි දිනයක් තීන්දු කර ගෙන ආණ්ඩුකාරතුමා ළඟට හරි, කවුරුහරි මේක තීන්දු කරන කෙනෙක්ගේ ළඟට ගිහිල්ලා පැයක හෝ පැය බාගයක පොඩි සංකේත වැඩ වර්ජනයක් කරන්න ඕන. මේක ආණ්ඩුවට හෝ මොකකටවත් විරුද්ධව නෙමෙයි කරන්නේ. ආණ්ඩුව ලොකු මහන්සියක් ගන්නවානේ ඒවා නිවැරදි කරන්න. ආණ්ඩුවට ඇත්තටම ලොකු වුවමනාවක් තියෙනවා මම දන්නවා පරිසරය සම්බන්ධව. මේ ප්‍රශ්න පිළිබඳව ඒක නිසා මේකේ එහෙම පරීක්ෂණයක් යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මම මෙහෙම කරන්නම් මේකට. ඒකට මම ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කරන්නම් සභාවට එන්න කියලා. අපිට එතකොට තියෙන ගැටළු කතා කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙම තියෙන්නේ දැන්. වැඩේ තියෙන්නේ මේ ආයතනය වැරදියි කියන එක දැන් හැම තැනින්ම ඇවිල්ලා තියෙනවා. හැබැයි එකක් තියෙනවා දැන් බැලුවම නුවර සිද්ධිය පටවන්න යන්නේ ඇත්තටම මහා නගර සභාවට. මහා නගර සභාවේත් වැරැද්දක් තියෙනවා. ඒක වෙන කතාවක්. හැබැයි කවුද මූලික වැරැද්ද කරන්නේ. පතල් හා භූ විද්‍යා එකෙන් ගෙනාපු නිර්දේශයක් එක්කනේ හදන්නේ. දැන් එතනදී ඉංජිනේරුවා පිළිබඳ ප්‍රශ්නය එනවා. වරලත් ඉංජිනේරුවෙක්ද කියලා ප්‍රශ්නය එනවා. දැන් බලන්න අපේ වරලත් ඉංජිනේරුවෝ දෙන ඒවා. ඉතිං මම දැක්කේ අපි කාටවත්, සමස්තයටම එදා ඒක බැරි වුණා. අපේ ආණ්ඩුකාරතුමා හිටියේ නෑ ඒ අවස්ථාවේ. කතා කරන්න හම්බවෙච්ච අවස්ථාව ඒක. නැත්නම් මම ඒ ටික කියනවා එතනදී. එතුමා ගිහිල්ලා අවශ්‍ය අවස්ථාවේදී. මම නම් නිකං හරි සඳහන් කරා. අපි කියන්නේ ඇත්තටම මේක කරන්න ඕන ආණ්ඩුවේ ඇස් අරවන්න නෙමෙයි. ආණ්ඩුව හරි තැනකට යොමු වෙලා තියෙනවා දැන්. මේ මාධ්‍ය තියෙනවා නේද, මාධ්‍යවලින් අපි රණ්ඩු වෙච්ච එකක් විතරයිනේ දාන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම ඔය මහනුවර සිද්ධියත් අපිට හොඳ ප්‍රවිශ්ඨයක්. බොරු කියන්න ඕන නැහැ. හොඳ ප්‍රවිශ්ඨයක්. කවුරුවත් අමනාප වෙන්න ඕන නැහැ. කවුරුවත් තරහවෙන්න ඕනත් නැහැ. අපි හදමු මේකේ තියෙන අඩුපාඩු ටික. හදලා ආණ්ඩුකාරතුමාට යවමු ඒකත්. අනෙකුත් අදාළ ආයතන ඔක්කොටම යවමු මෙන්න මේකයි තත්ත්වය මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් කරන්න කියලා. ඒකනේ වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා අපි ගිහිල්ලා පැයක් පොඩ්ඩක් අතන ඉමු. ආණ්ඩුකාරතුමාටවත්, ආණ්ඩුවටවත් විරුද්ධව නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඉස්සෙල්ලා මෙහෙම කරමු. අබේසේකර මන්ත්‍රීතුමා අපි ඉස්සෙල්ලා ඒක කරන්න කලින් අපි අදාළ සියලුම තැන්වලට යවමු. ආණ්ඩුකාරතුමාගේ ඉඳගෙන ජනාධිපතිතුමා දක්වා සියලුම තැන්වලට පොදුවේ වාර්තාවක් හදලා ඒ වාර්තාවෙන් දැනුම් දෙමු. අපි මාසයක් බලමු. මාසයක් බලලා අදාළ ක්‍රියාමාර්ග ගන්නේ නැත්නම් එහෙම කරන්න බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඇත්තටම එකක් තියෙනවා. දැනට අපි එහෙම දෙයක් කරොත් අපි කියන්න ඕන එන්.බී.ආර්.ඕ. එකට, මේකේ නුසුදුසු විදියට හදලා තියෙන, පස් කපලා තියෙන තැන් තියෙනවානම් ඒවා පෙන්වලා අර ස්ටිකරයක් ගහලා හරි මේක නතර කරන්න කියලා. දැන් ඇත්තටම එකක් තියෙනවා මම දකින දේ නම් මේකේ හරි මේවා එකක් යන්නනම් අපි පැයක් කරමු. අපි කාටවත් විරුද්ධව කරනවා නෙමෙයිනේ. හැබැයි අපි විරුද්ධයි මුන්ට. ඒක අපි හැමදාම කියනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. නමුත් මම ඉන්න මතය නම් අපි ඉස්සෙල්ලා මේක දැනුම් දෙමු. එතකොට අපි මේක කරන කොට ආණ්ඩුකාරතුමා දන්නවා එයාගෙත් වැරැද්දක් තියෙනවා කියලා. මේ අය මේක දැනුම් දීලා තියෙනවා. අපෙනුත් මේකේ අඩුපාඩුවක් වුණා කියලා දන්නවා. අපි ඉස්සෙල්ලා මේක හදමුකෝ. අපි අබේසේකර මන්ත්‍රීතුමා අඩුපාඩු ටික දැන ගන්න එපැයි. ඉස්සෙල්ලා මන්ත්‍රීවරු දැන ගන්න ඕන. අපි ඒක හදමු. මේ ඉඩමේ තියෙන අඩුපාඩු ටික මෙන්න මේක. එහෙම කියලා මේකේ සම්පූර්ණ වාර්තාවක් හදලා සභාව විදියට කවුරුත් දැනුවත් කරමු. කරලා ඒකට ක්‍රියාමාර්ග ගමු. එතකොට අපි තමයි මේකේ මූලිකත්වය ගන්නේ. අපිට කවුරුවත් නම්‍යශීලි වෙන්නේ නැත්නම්, අපිට උත්තර දෙන්නේ නැත්නම් එතනින් එහාට අපි ඒ ක්‍රියාමාර්ග ගමු. ඔය ඕන ඉඩමකට ගන්න. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීමණ්ඩලයේ සියලුම දෙනාගෙන් අවසරයි. මම නම් මේ සම්බන්ධව මුලින්ම අදහස් කරන්නේ අපි මේ කඳු තියෙන ඉඩම්වල ගෙවල් හදන එක වැරදියි මුලින්ම සභාවක් විදියට. මොකද ඒකට හේතුව අපි කවුරුත් කල්පනා කරලා බලන්න ඕන. ඒ කාලයේ තේ වත්තක් තිබුණම තේ වත්තේ මුදුනෙම තමයි ගෙයක් හදා ගන්නේ. බංගලාව හදාගෙන එතනින් එහාට ඒ තේ වතු ටිකේ තමයි මේ ගෙවල් හැදුනේ. හැබැයි ඒක මොකටද සුදුසු වෙලා තියෙන්නේ. තේ වගාව සඳහා තමයි සුදුසු වුණේ. අද තේ වගා කරපු ඉඩම් තමයි මේ විදියට කපලා කපලා, කන්ඩි කපලා වෙන්දේසි කරන්නේ. වෙන්දේසි කරන්න ගියාට පස්සේ තට්ටුවෙන් තට්ටුවට කපන්නේ. මෙන්න මෙහෙම කන්ද තියෙන කොට මෙතන ගේ හදා ගන්න මෙහෙම කපන්න ඕන පැහැදිළිවම. ඒක මම හිතන්නේ අපේ ප්‍රාදේශීය සභාව නෙමෙයි පාර්ලිමේන්තුවත්, ජනාධිපතිතුමත් දැන ගන්න ඕන මේ කාරණය. මෙහෙම කපලා මෙහෙම කැපුවම ටික කාලයක් තියෙනවා. වතුර ටික තැන්පත් වෙනවා. පහළට එනවා. දැන් ඔය හපුගල ඉඩම පැහැදිළිවම කඩා ගෙන යනවා. ඒක කාටවත් වළක්වන්න බැහැ. දැන් මේ මෙතන ඉස්සරහ පේන කන්ද උදාහරණයක් විදියට බලමු. මේ කන්දක් උඩ පේන්න තියෙනවානේ. ඒ කන්දෙත් තව කාලයක් යනකොට ගෙවල් හදාවී. හදන්න අපේ සභාවට ඒවී. හැබැයි ඒකත් නාය යනවානේ. මේවා සුදුසු තැන් නෙමෙයි. එහෙමනම් අපි සභාවක් විදියට මේකට තීන්දුවක් ගන්න ඕන මේ ඉඩම්වල ගෙවල් හදන්න දෙනවද කියලා. දැනටමත් මේ වගේ තැනිතලා ඉඩම් තියෙනවා. ඒවා ගෙවල් හදන්න හොඳයි. නමුත් කඳු වල හදන්න හදන්න මේ ප්‍රශ්නය අපිට දිගින් දිගටම එනවා. ඊට පස්සේ ආවට පස්සේ මොකද වෙන්නේ සභාපතිතුමා. ආවට පස්සේ එන්නේ සභාවට. කණ්ඩිය කඩාගෙන වැටුණට පස්සේ එක්කෝ මන්ත්‍රීවරයාව හොයා ගෙන එනවා. ඊට පස්සේ මන්ත්‍රීවරයා සභාපතිවරයා ගාවට එනවා. එතනදී ප්‍රශ්නය එන්නෙත් අපිටමයි. ඒ පාර පැති බැම්ම සභාවෙන් හදලා දෙන්න ඕන.

දැන් මේකටම අදාළ දෙයක් තමයි පාරවල්. වෙන්දේසි කරලා අවුරුදු පහක් යන්න කලින් පාරවල් කැඩිලා. දැන් හොඳම උදාහරණය තමයි වටරැක කොඩිතුවක්කු මහත්තයා වෙන්දේසි කරපු ඉඩම. මේවා පොඩ්ඩක් අපි උදාහරණයට ගමු. දැන් ඒ එක පාරකවත් යන්න බැහැ. තනිකරම ගල් ගොඩවල් විතරයි තියෙන්නේ. මම නම් කියන්නේ ඒවායේ ඉතුරු ඉඩම් කෑලි ටික විකුණන්න දෙන්න නරකයි මේ පාරවල් හදනකම්. පැති කාණු නැත්නම්, පාරවල් නැත්නම් ඒවා දෙන්න නරකයි. මොකද, සභාව එපැයි නඩත්තු කරන්න. අන්තිමට දේශපාලඥයාගේ පස්සේ ඇවිල්ලා රටේ ඉන්න මහජනතාවගේ පොදු අරමුදල් තමයි අර වැඩ වලට ඉදිරිපත් කරන්න වෙන්නේ. ඒක නිසා අපි ඉස්සෙල්ලම තීන්දුවක් ගන්න ඕන. සභාවක් විදියට මම දන්නේ නැහැ මේක යූ.ඩී. එකට අයිතිද, කාට අයිතිද කියලා. කාට අයිති වුණත් එන්නේ මෙතනටනේ ප්‍රශ්නය. අපි සභාවක් විදියට තීන්දුවක් ගන්න ඕන. ඉස්සෙල්ලා මේකට අනුමැතිය දෙන්න පුලුවන්ද කියලා සභාවේ මන්ත්‍රීවරු විදියට ගිහින් බලන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ. අපිටනේ මේ ප්‍රශ්නය එන්නේ. මම හිතන්නේ ඒකට අවධානය යොමු කරවනවා නම් හොඳයි කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මතුකරපු කාරණයට අදහස් දක්වන්න ඕන. මම නෙමෙයි ඔය කවුරු මෙතනට ඇවිල්ලා සභාපති වුණත් අබේසේකර මන්ත්‍රීතුමා දන්නවා මෙතන කෙරෙන ක්‍රමවේදයක් තියෙනවා. ඔය දැන් ෆිනෑන්ස් ඉඩම් ගත්තම ඕන ෆිනෑන්ස් ඉඩමකට සභාව තමයි අන්තිමට අවසරය දෙන්නේ. කලින් යූ.ඩී. එකට තියෙන ඒරියා එකේ ඒවට යූ.ඩී. එකෙන් අවසරය දුන්නා. ඊට පස්සේ නෛතික බලය තියෙන්නේ සභාවට. නමුත් අදාළ ආයතන පත්කරලා තියෙනවා ඒ පිළිබඳව මූලිකව අනුමැතිය ගන්න. ඒක කඳු සහිත ප්‍රදේශයක් නම් ඒකට අබේසේකර මන්ත්‍රීතුමා දිගින් දිගට කතා කරපු විදියට එන්.බී.ආර්.ඕ. එක තියෙනවා. ඊට පස්සේ කුඹුරු සම්බන්ධ එකක් නම් පහත් බිම් එක තියෙනවා. දැන් ඒ අදාළ ආයතන පත්කරලා තියෙද්දිත් ෆිනෑන්ස් ඉඩමක් කරන කොට ඒ අදාළ ආයතන වලින් නිර්දේශ අරගෙන තමයි අපි ළඟට එන්නේ. අවසානයේ එන්නේ අපි ළඟට. මොකද අපිට බලයක්

නැහැ තනි හිතුමතේට අනුමැතියක් නොදී ඉන්න. ඒක මේ කවුරුත් දන්නවා. මම නෙමෙයි මෙතන ඔය ඉන්න ඕන කෙනෙක් ඇවිල්ලා වාඩි වුණත්, එන පොදු ප්‍රධාන ගැටලුවක් මේ. අදාළ සුදුසුකම් ටික ඒ අය සම්පූර්ණ කරලා ආවොත් දෙන්න ඕන. අපිත් දාන කොන්දේසි තියෙනවානේ. කාණු පද්ධතිය දාන්න කියනවා. පාරවල් කොන්ක්‍රීට් කරන්න කියනවා. පැති බැම් දාන්න කියනවා. ඒවා කරලා ඉවර වුණාට පස්සේ අපිට අවසරය දෙන්න සිද්ධ වෙනවා. ඇත්ත කාරණය ඕක. ඉතිං එතනදී සුගත් මන්ත්‍රීතුමා කියපු විදියට බෝපෙ පෝද්දල තියෙන්නේ කඳු ඉඩම්. ඉතිං ඒකට තමයි එන්.බී.ආර්.ඕ. එකේ නිර්දේශයක් ගන්නේ. එන්.බී.ආර්.ඕ. එක කියන්නේ ඒ සම්බන්ධව ප්‍රවීණතාවයක් තියෙන ආයතනය. ඉතිං අබේසේකර මන්ත්‍රීතුමා ගේන්නේ ඒ තර්කය මේ ආයතනය දූෂිතයි කියලා. තේරුණාද, ඒ ආයතනය, පහත්බිම් එක ක්‍රියාකරන එක හරි. ඊට අමතරව මුලින්ම මම දන්නවා නාගරික සංවර්ධන අධිකාරියෙන් ක්ලියරන්ස් එක ගන්න ඕන. ඒ ක්ලියරන්ස් එක අරගෙන තමයි මොන දේ වුණත් පටන් ගන්න ඕන. එතනින් දෙන නිර්දේශ මත කරන්න ඕන. ඉතිං ඒ සියලුම සුදුසුකම් සම්පූර්ණවෙලා අපි ළඟට ආවට පස්සේ අපිත් කොන්දේසි දෙනවා. අර මම කලින් කිව්වා වගේ පාරවල් කොන්ක්‍රීට් කරන්න කියනවා. කාණු කොන්ක්‍රීට් කරන්න කියනවා. පැති බැම් දාන්න කියනවා. ඒවා කරලා සම්පූර්ණ වුණාට පස්සේ තමයි අපි අවසර දෙන්නේ. දැන් ඕක තමයි පොදු කාරණය ඉතිං. එහෙමනම් පොදු තීරණයක් අරගන්න ඕන. ලංකාවේම ෆිනෑන්ස් ඉඩම් කරන එක තහනම් කරන්න ඕන. මොකක් හරි එහෙම ක්‍රියාමාර්ගයකට යන්න ඕන. අපිට තීරණය කරන්න පුළුවන්ද කඳු වලට දෙන්න බැහැ කියලා. එහෙම කරන්න බැහැ. ඒකට තමයි එන්.බී.ආර්.ඕ. එක තියෙන්නේ. එන්.බී.ආර්.ඕ. එක දෙන්න ඕන එහෙමනම් මේක සුදුසු නැහැ කියලා. ඔක්කොම සුදුසුකම් සම්පූර්ණ කරලා සභාවට ආවම දෙන්න ඕන. ඒක තමයි අපි මේ කලින් කිවුවේ. ඇක්සස් ඉඩමේ අක්කර හතරක් කලින් එන්.බී.ආර්.ඕ. එක දෙන්න බැහැ කියලා කිවුවා. එතකොට හරි. ඒ අක්කර හතර අතඇරලා ඉතුරු ටික ෆිනෑන්ස් කරන්න කිව්වා.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගාල්ලේ එන්.බී.ආර්.ඕ. එකට බැහැ. කොළඹ එකට පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොළඹ එන්.බී.ආර්.ඕ. එකෙන් එවුවා ඒ අක්කර හතරත් ෆිනෑන්ස් කරන්න කියලා. ඒ අදාළ ආයතන වලින් එනකොට අපි හිර කරනවා නම් මොකක්ද කියන්නේ. එක්කෝ මේ සල්ලි ගන්න හිරකරනවා. සභාපතිවරයා කරන්නේ මේක කියලා කියනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගමට හොරු ගේනවට ගහලා එලවන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා අතින් පයින් කරන්න පුලුවන් දෙයක් නම් කරමු. එහෙම කරන්න බැහැ. ඔය මෙතන එකට මෙතන වාඩි වෙලා හිටියත් මේ යන්න වෙන්නේ නීතියත් එක්ක. නොදී වෙච්ච දෙයක් තියෙනවා මෙන්න. මේකට දැන් කවුද උත්තර දෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඕක අනිවාර්යයෙන්ම ගන්නවා. ගරු සභාපතිතුමනි, මේක හරි. ඔබතුමා කිවුවේ ඉහළින් කරාම පහළ අපිට දෙන්න ඕන කියන එකනේ. මම කියන්නේ ඒක නෙමෙයි මේකේ දූෂිතම වැඩේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්න කියන්න. ඉහළින් කන්ද දැක්කම වැඩේ හදා ගන්නවා ඒ අය. අපි හිතමු එන්.බී.ආර්.ඕ. එක කියලා. ඒ අය ප්ලෑන් එක හදා ගන්නවා. මේ ඉඩම හරි ලස්සනයි හදන්න පුලුවන්. දෙන්න පුලුවන් ඒ නිසා හරිගස්සවලා දෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කතා කරන්න ඕන මේ පනතත් එක්ක. හරිද,

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පනත නෙමෙයි අපි කියන්නේ. පනත තිබ්බිඡාවේ. පනත ගලපන්න පුලුවන්ද කියලා බලමු අපි. එතකොට ඒ අය හදා ගන්න ඕන මේක දෙන්න ඕන විදිය. පළවෙනි එක දුන්නා. ඊට පස්සේ නාගරික සංවර්ධන අධිකාරියට දැම්මා. ඒකත් දෙනවා. හැබැයි දෙනකොට අපිට හිතෙනවා මේවා නිකං දෙන්නේ නැහැ කියලා. සල්ලි අරගෙන, මොනවා හරි අරගෙන දෙනවා කියලා හිතෙනවා. නිකං නැත්නම් මේ කොහේවත් තියෙන කඳු කඩන් වැටෙන ඉඩම්වල ගෙවල් හදලා දීලා අන්තිමට නරක නාම ගන්න ඕන නැහැනේ. නරක නාම ගන්න කොට තියෙන්න ඕනනේ මොකක් හරි. ලාභයක් තියෙන්න ඕනනේ. අපි එහෙම චෝදනා කරනවා. ඒක හින්දා අපි තීන්දුවක් ගන්න ඕන සභාව විදියට. අපිට ප්‍රශ්නයක් නැහැ ඕන කෙනෙක් මේක ගිහින් කියපුවාවේ. සභාවක් විදියට නගර සභාව හරි ප්‍රාදේශීය සභාව හරි ඉස්සරවෙලා තීන්දුවක් ගන්න ඕන මේ ඉඩම දෙන්න පුළුවන්ද කියලා. එහෙමනම් අපි ඔක්කොම එකට වගකීම ගන්න ඕන සියලු දෙනා එකට. සභාවයි, නාගරික සංවර්ධන අධිකාරියයි, එන්.බී.ආර්.ඕ. එකයි ඔක්කොම එකට තීන්දුවක් ගන්න ඕන මේක දෙන්න පුලුවන්ද කියලා. එහෙම නොගියොතින් ඉතිං මේක හැමදාම දීලා බලාගන්න මොකද වෙන්නේ කියලා. රටේ මේ ප්‍රශ්නය ඉවර වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු සභාපතිතුමා, මම පොඩ්ඩක් අවධානය යොමු කරනවා ඔබතුමාගේ. බලන්න මම 2004.06.25 සභාවට යෝජනාවක් දාලා තියෙනවා. ඒ දාලා තියෙන යෝජනාව සම්මත වෙලා තියෙනවා. "ඉඩම් වෙන්දේසිකරුවන් සඳහා දැනට සභාවේ ඇති නීති රීති වලට අමතරව වෙන්දේසිකිරීමට යෝජිත ඉඩම වැඩි දියුණු කිරීමට ප්‍රථමව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පරිසර කමිටුවේ වාර්තා ලබා ගෙන මහා සභාවේ අනුමැතිය ලැබුණු පසු පමණක් වැඩි දියුණු කිරීමට අවසර දිය යුතුය." ඇත්තටම අපිට තේරෙනවා නම් මේ ඉඩම නරකයි කියලා ඒක කපන්න කොටන්න ඉස්සෙල්ලා කියන්න ඕන. මේකේ මානුෂික පැත්තකුත් තියෙනවා. ඒ මානුෂික පැත්තට ඔබතුමන්ලා අපි කවුරුත් අහුවුණා. මේකට හැබැයි විසඳුමක් තියෙනවා. ඒකත් මම විසඳුමක් විදියට පහුගිය කාලයක ගෙනාවා. ඒ තමයි මට ඉඩමක් තියෙනවා. මට සල්ලි ඕන මගේ දරුවෙක්ගේ වැඩකට. එතකොට මට ඉඩම තිබිලා වැඩක් නැහැ මේක විකුණන්න බැරිනම්. ඇත්තටම වෙන්දේසිකාරයෙක් මේක ගන්නේ ⅓ ට. අපි ඇක්සස් එක උදාහරණයකට ගමුකෝ. ඔය අක්කර 04 උදාහරණයට ගමු. ඔය හැම එකම ගත්තේ ⅓ ට. මම හිතන්නේ නැහැ රුපියල් පනස්දාහක් වුණා කියලා පර්චස් එකක්. එතකොට මම යෝජනාවක් විදියට කරා. ඒ අහිංසක මිනිහට ඉඩම දීලා සල්ලි අරගන්න ඕන දරුවගේ ප්‍රශ්නයට. එහෙනම් අපිට සභාව විදියට මැදිහත් වෙන්න ඇහැකි මෙන්න මේ යෝජනාව ක්‍රියාත්මක වුණා නම්. සභාව මැදිහත් වෙලා හෝ රජය හෝ මැදිහත් වෙන්න ඕන. මම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවටත් මේ යෝජනාව ඉදිරිපත් කරා. අද ඒක ඔබතුමා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවටත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් ඉදිරිපත් කරන්න එවැනි ඉඩම් ආණ්ඩුව විසින් මිලදී ගෙන කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එහෙමනම් එහෙම ක්‍රමවේදයකට යන්න ඕන. එතකොට අපි ළඟට එන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** කවුරු කරත් අන්තිමට එන්න ඕන අපි ගාවට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** අන්තිමට නෙමෙයි මුලින්ම එන්නේ පැති බැම් වලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අබේසේකර මන්ත්‍රීතුමා මේකයි. ඔබතුමා මේකේ එක්ස්පර්ට්නේ. ඔබතුමා මේකේ යන්න ඕන තැන් හැමතැනම රිංගපු කෙනානේ. ඇත්ත කතාව ඒක. ඒක හොඳයි. ඒක මම වැරදි ආකල්පයෙන් කියන එකක් නෙමෙයි. ඉතිං ඒකේදි මම ඔබතුමාට කියන්නේ අදාළ ආයතන සියල්ලෙන්ම සුදුසුකම් ටික සම්පූර්ණ කරලා ආවට පස්සේ අපිත් කොන්දේසි දෙනවා. ඒ කොන්දේසි ටිකත් සම්පූර්ණ කරාට පස්සේ අපිට නොදී ඉන්න ක්‍රමයක් කියන්න මට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මම නිකං මෙහෙම අහනවා. අපි ඇක්සස් ඉඩමෙන් පීල්ලට වන හානිය නිසා ගෙනාවා කාණු පද්ධතියක් දාන්න කියලා. මේකේ ඩිසයින් එක තාක්ෂණ නිලධාරීන්, ඉංජිනියර්ස්ලා කවුරු දුන්නත් බලන්න මේ කාණු පද්ධතිය දීලා තියෙන්නේ කොහොමද කියලා. හුණ්ඩුවක් විතර කාණුවක් එනවා මෙච්චර විතර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකේ වැරැද්ද කාගෙද, වැරැද්ද සභාවේනේ. මම කියන්නේ ඒක නෙමෙයි අබේසේකර මන්ත්‍රීතුමා. මම ඔබතුමාට කියන්න හදන එකට උත්තරයක් දෙන්නකෝ උදාහරණ නැතුව. අදාළ ආයතන සියල්ලම සුදුසුකම් සම්පූර්ණ කරලා ඇවිල්ලා තියෙන්නේ. ඉස්සෙල්ලම යූ.ඩී. ක්ලියරන්ස් ගන්නවා. ඊට පස්සේ සභාවේ කොන්දේසි දාන ටික වැරදි නම් ඒක අපිට බේර ගන්න පුලුවන්. ඒක සභාව කතා කරලා මෙන්න මේක අඩුයි, මෙතනට කාණුවක් එන්න ඕන කියලා, මෙතනට බැම්මක් එන්න ඕන කියලා ඒ ටික හදාගන්න පුලුවන්. ඒ ටික අපේ ප්‍රශ්නයක්නේ. එතනට වෙනකම් ආවම අපිට නොදී ඉන්න ක්‍රමයක් මට කියන්න.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක නිසාම තමයි මගේ මේ යෝජනාව 2004 දී ගෙනල්ලා තියෙන්නේ. මේකේ වෙන්දේසි කරන්න කලින් ආවානම් අපි කියනවා කොහොමවත් මේක කරන්න එපා කියලා. මේකට උපක්‍රමයක් විදියට සමහර තැන්වල මෙහෙම කරනවා. ඉඩම අයිතිකාරයාගේ නමින් තමයි අනුබෙදුම යන්නේ. එහෙම කරපුවා තියෙනවා පෝද්දල ඔය වගේ තැන්වල. අපිට දීපු ලැයිස්තුව ගත්තම තියෙනවා. ඒ අයගේ නමින් යන්නේ ඇයි. දන්න කියන මනුස්සයෙක්නේ. වෙන්දේසිකාරයෙක් නෙමෙයිනේ. ඒ නිසා දෙන්න වෙනවා. මේක අරගත්තට ඒ අය දන්නේ නැති දෙයක් තියෙනවා. ඒ කියන්නේ කවදා හරි දවසක ඒ අයට බදු ගෙවන්න ආවට පස්සේ බදු ගෙවන්න වෙන්නේ ඒකෙන්. ඊළඟට ඇත්තටම මම දැක්කේ අපි මේ වාර්තාව හදමු. මම නම් දැක්කේ මේ ආණ්ඩුවට වැඩපිළිවෙලක් තියෙනවා. ආණ්ඩුවේ ඇස් අරවන්න ඕන නැහැ. හරි විදියට දැනෙන්න ඕන. ආණ්ඩුකාරතුමා හිටපු වෙලාවේ කතා කරානම් අපිට මේ ටික දා ගන්න තිබුණා. නමුත් ඇත්තටම එකක් තියෙන්නේ එතුමාට විරුද්ධවත් නෙමෙයි මේක යන්නේ. මෙන්න මේකට එවන්න පතල් හා භූ විද්‍යා එකේ එක්කෙනෙක්. පරිසර අධිකාරියෙන් එක්කෙනෙක් එවන්න. ඒ අය ඇවිල්ලා අපි ළඟදී කරන්න. මේ කරපු ඉඩම් හරියට කරලද කියලා බලන්න. ඉතිං මම දැක්කේ අපි

පැය දෙකක් ඔතන ලැග්ගොත් මේ වැඩේ හරියට වෙනවා. එතකොට ලංකාවේ හැම තැනම තියෙන ප්‍රාදේශීය සභාවල් මේක බලාවී. මේ වගේ පස්සෙන් යන සාධාරණ මිනිස්සු ඉන්නවානේ. ඒ අය මේක බලාවි. එතකොට ජනමතයක් ඇති වෙනවා හැම තැනම මේ වැඩේ වෙනවා කියලා. එතකොට පතල් හා භූ විද්‍යා එකත් බයවේවි මේ වගේ දේවල් දාන්න. එහෙම නැත්නම් අපේ අයම කියනවා මේක හරියට කපලා තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ සම්බන්ධව සභාවේ දීර්ඝකාලයක් තිස්සේ මතුවෙන ගැටළු තියෙනවා. සභාපතිතුමා කියන එකෙත් සාධාරණයක් තියෙනවා. හේතුව දැන් අපිට පහත් බිම් එකෙන්, එන්.බී.ආර්.ඕ. එකෙන් අනුමත වෙලා සභාවට ආවම දෙන්න වෙනවා. ඇත්තටම සභාවට ආවම තියාගෙන ඉන්න බැහැ. එහෙම තත්ත්වයක් උදා වෙනවා. හැබැයි ඒකට මම දන්න විදියට මෙහෙම දෙයක් කරොත් හොඳයි කියලා හිතෙනවා. සභාපතිතුමනි, අපි එන්.බී.ආර්.ඕ. එකට, යූ.ඩී. එකට, පහත් බිම් එකට සභාවෙන් යෝජනාවක් සම්මත කරලා ලියුමක් යවන්න ඕන ඒ අය යම්කිසි දෙයක් කරනවා නම් වෙන්දේසි ඉඩමක් සම්බන්ධව ඒ අයට කියන්න අපේ සභාවෙන් අහන්න කියලා මේක සුදුසුද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනදී අපි කරන අඩුපාඩුවක් තියෙනවා. ඒකත් කියන්න ඕන. ඇත්තටම අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ අර ඉඩම සුද්ධ කරන්න කලින් අනුමැතිය අරගෙන නැත්නම් අපිට තීරණයක් ගන්න පුළුවන් මේක වෙන්දේසි කරනවාද, නොකරනවාද කියලා. ඒක අපිට ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක තමයි මම කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපිට කරන්න පුලුවන්. අදාළ ආයතන වලින් ඇවිල්ලා කොන්දේසි දෙන්න කලින් කරන්න පුලුවන්. නමුත් ඒක කෙරෙන්නේ නැහැ. මම අද දවසේ දැන් කියන්නම් අද වෙනකොට මවුන්ට්ප්ලසන්ට් එකේ ඝාගොඩ මහත්තයාලගේ අක්කර පහේ ඉඩම කපනවා. දැන් තාක්ෂණ නිලධාරි ඉන්නේ උසාවියට ගිහිල්ලා. අපි ඒකට සභා තීන්දුවක් ගන්න ඕන අලුතින් හරි ආයේමත් අවසර ඉල්ලන්න ඕන කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකයි මම කිවුවේ මේක විශේෂ සභාවක්. අපේ බලප්‍රදේශය තුළ එහෙම දෙයක් යූ.ඩී. එකෙන් හරි, පහත් බිම් එකෙන් හරි දුන්නා නම් අපිට ඒ අයට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් සභාපතිතුමා සභා තීන්දුවක් අරගෙන තිබුණොත්. අපි සභාවේ ඒකමතිකව සම්මත කරලා තීන්දුවක් ගන්න ඕන අපේ බලප්‍රදේශය තුල යම් කිසි ඉඩමක් හෝ නිවසක් අනුමත කරන්න ආවානම් ඒ අයට මුලින්ම අපේ සභාවෙන් විමසීමක් කරන්න කියන්න. ඊට පස්සේ අපේ සභාවෙන් වාර්තාවක් දෙනවා ප්‍රශ්නයක් නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක කලිනුත් යවලා තියෙනවා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ වුණාට ක්‍රියාත්මක වෙන්නේ නැහැනේ. නමුත් නඩුවක් යන්න පුලුවන් එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ දැන් පුද්ගලිකවත් කරනවානේ. ෆිනෑන්ස්කාරයෝ නෙමෙයි කරන්නේ පුද්ගලිකව. ඔය බෙදීම වෙන්කර ගන්න ඕන ඉස්සර වෙලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙහෙමයි. සමහර කට්ටිය ඉන්නවා සභාපතිතුමා එහෙම කරන. දැන් වෙන්දේසිකාරයෝ ඉඩම ගන්නේ නැහැ. අපේ පැත්තෙත් එහෙම දෙක තුනක් වුණා. වෙන්දේසිකාරයෝ ගන්නේ නැහැ. අදාළ පුද්ගලයාගේ නමින්ම ඉඩම තියා ගන්නවා. ඉඩම කරන කෙනා කරන්නේ කෑලි කරලා විකුණනවා. විකුණලා එයාම තමයි ඔප්පු ලියලා දෙන්නෙත්. වෙන්දේසියට ගන්නේ නැහැ. ඒක කෑලි කරලා විකුණනවා. එතකොට මිනිහා මාට්ටු වෙන්නෙත් නැහැ වෙන්දේසියේ දාන්න ඕනත් නැහැනේ. ඒ වගේ සිද්ධි හුඟක් සිද්ධ වෙනවා. ඉඩම් කෑලි විකුණනවා මුකුත් අනුමැතියවල් නැතුව. විකිණිලත් ඉවරයි. මම දැන් එහෙම දෙකකට කතා කරා. වැඩිය ඕන නැහැ අපේ ගෙවල් ඉස්සරහ එකක් කරලා කන්ද උඩ ගෙයක් හදනවා. ඒක විකුණලා. මොන නීතියක්වත් නැහැ. සල්ලි ගෙවන්න ඕනත් නැහැ. සභාවට ගෙවන්න ඕනත් නැහැ. ඒ මනුස්සයාගේ නමින්ම ඉඩම තියෙනවා. කෑලි කරලා විකුණනවා. මේවාට අපි හොඳ ක්‍රියාමාර්ගයක් ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ඕවා මේවා එකට යවමු. ඔබතුමාට මතක ඇති මම මේක කතා කරාට පස්සේ ලලිත් ගමගේ මහත්තයා නිවැරදි නීතිමය උපදෙසක් දුන්නා. ඇයි අපි හැරී හැරී

ඉන්නේ. මේවා දාන්න ගියාම තමයි ලොකුවට වෙලාව යන්නේ. සිවිල් උසාවියේ අපි තහනම් නියෝගයක් ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒ ඔක්කොම කරන්න පුලුවන් මහනුවර එතුමා ඉන්නවානේ දැන්. ඒ බලය ඔක්කොම තියෙනවානේ. ලලිත් යූ. ගමගේ මහත්මයාට ඔක්කොම ලේසියෙන්ම කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එයා ඇත්තටම ඒක හොඳට කරනවා. අපි හරි සතුටුයි. මම කිවුවේ දැන් අපි වහාම මේක කරන්න ඕන. අපි වහාම සිවිල් උසාවියේ හෙටම දාලා තහනම් නියෝගයක් ගමු. අපිට කරන්න තියෙන හොඳම වැඩේ ඒක. අදම ලියුමක් ගහලා කියන්න වහාම වැඩ නවත්වන්න කියලා. අද සභාවත් තියෙනවානේ. අපි යෝජනාවක් විදියටම ගෙනල්ලා තීන්දු කරමු වහාම නවත්වන්න කියලා. නැත්නම් අපි සිවිල් උසාවියේ දැම්මම එයාට තහනම් නියෝගයක් දෙනවා. සභාවක් ඉල්ලුවම කොහොමත් දෙනවානේ. ලලිත් ගමගේ ආණ්ඩුකාරතුමා කිවුවේ ඇයි මේක ගන්නේ නැත්තේ කියලා. ඒක හරි. මේක මෙච්චර දුර දිග යන්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පළාත් පාලනය සම්බන්ධ මේවා එකේදිත් ඒක සාකච්ඡා වුණා. අපිට වෙලා තියෙන හේතුව තියෙන්නේ අනුමත වෙලා ආවට පස්සේ නොදී ඉන්න බැහැ. ඒක ඇත්තටම කරන්න බැහැ. එහෙම අපි හිරවෙලා ඉන්නේ. අපි මේ හිරවීමෙන් බේරීමට නම් අපි නිසියාකාරව සභා තීන්දුවක් අරගෙන අපේ බලප්‍රදේශයේ අයව දැනුවත් කරලා අදාළ ආයතනත් දැනුවත් කරලා තිබුණා නම් අපිට පුලුවන් ඒ ආයතනයට විරුද්ධව නඩු දාන්න. එතකොට අපි බේරිලා. එතනදී යම් අවධානමක් සිදු වෙනවා නම් අපි බේරිලා. එහෙම තියෙද්දිත් මේක දීලා තියෙන්නේ. අන්න ඒක නිසා තමයි අපි කියන්නේ. අපේ බලප්‍රදේශය තුළ යම් කිසි දෙයක් කරනවානම් එහෙම කෙනෙක් යූ.ඩී. එකට යනවානේ ෆයිල් එක අරගෙන. ඒ අය මුලින්ම කරන්න ඕන අපේ සභාවට හරවලා එවන්න ඕන. සභාවෙන් ඊට පස්සේ වාර්තාවක් දෙන්න ඕන මේක සුදුසුද, නැද්ද කියලා. මේකට අපිට සභාවෙන් නඩුවක් වුණත් යන්න පුලුවන් ඊට පස්සේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, පැතුම් උයනේ ඉඩම සම්බන්ධව කතා කරන්නේ. පැතුම් උයනේ ඉඩම හදන වෙලාවේදීත් මම විරුද්ධ වුණා. දැන් ඒ බැම්ම කඩාගෙන ගිහිල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන බැම්මද,

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හිරිඹුරේ පැතුම් උයනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහා පැත්තේ දාපු එකද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ප්‍රධාන පාරෙන් ඇවිල්ලා තියෙන එක. ඒකේ කම්බි කෑල්ලක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර ඉඩමේ ඇතුලේ තියෙන බැම්මද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඇතුලෙන් කඩලා ගිහිල්ලා තියෙනවා. පාර අයිනේ ටිකත් කඩලා ගිහිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාණුවේ ටිකද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පාර අයින දිගට මේවා කරේ. සම්පූර්ණයෙන්ම කැඩිලා. එක කම්බි කෑල්ලක් නැහැ ඒ බැම්මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ අයට වහාම ඒක හදන්න කියන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අවුරුදු පහ සම්පූර්ණ වෙලත් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදාළ ආයතන සියල්ලටම අපි කලින් සභාවේ ගනිපු තීන්දුව අනුව දන්වලා තියෙනවා. අවුරුදු දෙකෙන් පස්සේ අවුරුදු පහට අඩු ඒවා ඔක්කොටම ලිඛිතව දන්වලා තියෙන්නේ. ඒ වගේම තාක්ෂණ නිලධාරීන්ටත් මම වෙනම ලියුම් ගහලා තියෙන්නේ. මේ මේ ඉඩමේ වෙන වෙනම බලලා නිර්දේශයන් දෙන්න කියලා. ඒ අනුව අදාළ ආයතන දැනට දැනුවත් කරලා තියෙන්නේ. අපි ලියුම් යැව්වට පස්සේ ඒ අය ලියුම් එවනවා මේ මේ අඩුපාඩු හැදුවා හෝ නැතුව හරි. අපි නැවත ඒක තාක්ෂණ නිලධාරීන්ට දාලා ඒ ක්‍රියාමාර්ගය ගන්නවා. ඒක අවුරුදු පහට අඩු කිට්ටුවෙන් යන ඒවාටත් ඒ ක්‍රියාමාර්ගය අරගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ ආයතන ඒකට ක්‍රියා නොකොලොත් මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නොකොලොත් නීතිමය ක්‍රියාමාර්ග වලට යන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තව වෙන්දේසි කරන්න තියෙනවානම් වහාම ඒවා නතර කරන්නත් ඕන.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් ඔය බූවැලිකඩ සිද්ධියට කලින් තමයි මෙහේ තීන්දු තීරණ ගත්තේ මෙවැනි වැඩසටහනක් කරගෙන යමුයි කියන කාරණය සම්බන්ධව. එතකොට බූවැලිකඩ සිද්ධියත් එක්ක ඒක දැන් උත්සන්න වෙලා තියෙනවා. ඒක අපිට පාදක කරගන්න පුලුවන් හේතුව විදියට. එතකොට දහනායක හාඩ්වෙයාර් එක තියෙන තැන හදපු එක මොන තත්ත්වයේද කියලා දන්නේ නැහැ. ඒක තට්ටු දෙකටත් හදාගෙන යනවා. දැන් ඔය වගේ ගෙවල් ගිහිල්ලා ඒ හාඩ්වෙයාර් එක ඇතුලේ ඉන්න මිනිස්සු මළොත් ඒවා මාධ්‍යයට ගිහිල්ලා මහා විශාල ප්‍රශ්න ඇති වෙනවා. ඉතිං ඒක නිසා කරන්න පුලුවන් උපරිම නීතිමය කටයුතු කරන්න සිදු වෙනවා. මෙතුමා කිව්වා වගේ පෞද්ගලිකව ඉඩම් වෙන්දේසි කරන්න බලන්නේ ජල සම්පාදන මණ්ඩලයෙනුත් බේරෙන්න. ජල සම්පාදන මණ්ඩලයෙන් දාන පයිප්ප වල රේට්ස්වල වෙනසක් තියෙනවා. පෞද්ගලිකව කෙනෙක් නල මාර්ගයක් ඉල්ලනවට වඩා එකසිය ගුණයක් විතර වැඩි වෙනවා ෆිනෑන්ස් කොම්පැනියක් ගන්න ගියෝතින්. ඒක නිසා එතනත් පොඩි උපක්‍රමයක් තියෙනවා. අපිට අහුවෙලා තියෙනවා එහෙම වැඩ කරනවා. ඒක නිසා තමයි මේකට හේතුව. අනිත් කාරණාව තමයි දැන් මේ කමිටුවක් පත් කරලා තියෙනවා මේ සම්බන්ධව හොයන්න ගරු මන්ත්‍රීවරුන්ගෙන්. ඒකට සම්බන්ධීකාරකවරයෙක්ව පත් කරන්න කාර්යාලයෙන්. එතකොට අපිට වුණත් පුලුවන් මොකක් හරි තොරතුරක් තියෙනවා නම් ඇවිල්ලා ඒ සම්බන්ධීකාරකවරයත් එක්ක සම්බන්ධ වෙන්න. එතකොට කවුරුහරි කෙනෙක්ව පූර්ණකාලීනව පත් කරන්න. එතකොට මේ කමිටුව රැස්කරන්න, මේ කමිටුවේ තොරතුරු ගන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඉන්ද්‍රජිත් මහත්තයාට භාර දෙනවා. ඉන්ද්‍රජිත් මහත්තයා ඒක බලලා සම්පූර්ණයෙන්ම සම්බන්ධීකරණ කටයුත්ත කරන්න මේ කමිටුවේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එතකොට අපිට වුණත් මේ කමිටුවේ නැති වුණත් ඇවිල්ලා ඉන්ද්‍රජිත් මහත්තයාව හම්බවෙලා පුලුවන් මේ කරුණු කාරණා පැහැදිළිව එයාට ඉදිරිපත් කරන්න. එයාට පුලුවන් ඒ ටික කමිටුවට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව හොඳයි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්න කියලා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඩයලොග් ආයතනයෙන් කණු වගයක් ඉන්දන්න ඇවිල්ලා ඉන්නවා. එක දිගට ප්‍රධාන පාරේ ඉඳලම ගෙනියනවලු කුළුණට වෙනකම්ම. ඩයලොග් තියෙන්නේ දැන් කලින් සන්ටෙල් වුණාට. දැන් මේ කණු ඉන්දන්නේ කොහොමද, මිනිස්සුන්ගේ ඉඩම්වල ඉන්දන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එක කණුවකට රුපියල් පන්සීය ගාණේ අය කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අය කරන්න මෙහෙන් දුන්නද අනුමැතිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දීලා තියෙනවා. තාක්ෂණ නිලධාරි අධීක්ෂණය යටතේ තමයි කණු සිටුවන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මිනිස්සුන්ගේ ඉඩම්වල කණු සිටුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම බැහැ. ඒක නවත්වන්න වහාම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙම නැත්නම් එතකොට ඉන්දන්නේ පාරේද. අනුන්ගේ ඉඩම්වලනේ ඉන්දන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම හිටවන්න බැහැ. සභා යෝජනාවක් තියෙනවා කණුවකට රුපියල් පන්සීය ගාණේ අය කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ මිනිස්සුන්ගේ ඉඩම්වල හිටවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම බැහැ. වහාම ඒක නවත්වන්න කියන්න. අපේ තාක්ෂණ නිලධාරි අධීක්ෂණය යටතේ සිටුවන්න ඕන. ඉඩ දෙන්න එපා කියන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම කියන්නම් වලවල් ටික වහලා දාන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉඩ දෙන්න එපා කියන්න. හැබැයි ඉතිං ඔතන මෙහෙම ප්‍රශ්නයකුත් එනවා. ඒක බේරන්නත් ඕන. දැන් මෙහා පැත්තට කරොත් කියාවි පාරට කියලා. එහා පැත්තට කරොත් ඉඩම්වල කියාවි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ අය අනුමැතිය අරගෙන කියලා කියනවලු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනුමැතිය දීලා තියෙන්නේ මෙහෙමයි. අපි අයවැයෙනුත් පෙන්වලා තියෙනවා ඒක. අනුමැතිය දෙන්න ඕන. නමුත් කණු හිටවන්න ඕන අපේ අධීක්ෂණය යටතේ. අනිත් එක තමයි දැන් ඕක හරියට බලන්න වෙනවා. පාරේ ගැට්ටේ ඉඳන් ගත්තම මිනිස්සුන්ගේ ඉඩම්. දැන් එහෙමනේ වෙලා තියෙන්නේ ඇත්ත කතාව. අපි කලබල වෙන එක නෙමෙයි කරන්න ඕන මෙතනදී. අපි බලන්න ඕන හරියටම ඔය කියන කතාව ඇත්තද කියලා. අපේ නිලධාරියෙක්ව යවන්න. ඒ අයව දැනුවත් කරන්න අපේ නිලධාරීන් නැතුව කරන්න බැහැ කියලා. අපේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කරන්න ඕන. පාරේ ඉඳන් අඩි කීයකටද අහන්න හිටවන්නේ. හැබැයි ඉතිං මෙහෙම දේකුත් තියෙනවා මන්ත්‍රීතුමා. කාණුවෙන් මෙහා පැත්තෙන් කරොත් කියනවා පාරේ කියලා. කාණුවෙන් එහා පැත්තේ කරොත් කියනවා ඉඩම් අයිතිකාරයොන්ගේ කියලා. ඉතිං ඔය ප්‍රශ්නය තියෙනවා. මට හරියට කියන්නකෝ. කාණු දාන්නෙත් මායිමේ අයිනේ. එතකොට දැන් කාණුවෙන් මෙහා පැත්තේ හිටෙව්වොත් පාරේ කියනවා. කාණුවෙන් එහා පැත්තේ හිටෙව්වොත් ඉඩමේ කියනවා. ඒ පාර නැත්නම් කියනවා කාණුවේ හිටෙව්වා කියලා. ඕකත් මිනිස්සුන්ට ඕන දෙයක්නේ. මිනිස්සුන්ට අනවශ්‍ය දෙයක් නම් එපා කියන්න පුලුවන් හිටවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සන්ටෙල් එකෙන් කොහොමද මේ අයට දෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සන්ටෙල් එක, ඩයලොග් එකෙන් ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි අපේ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය නැතුව ඒ අයට කරන්න එපා කියන්නකෝ. එතකොට ඉවරයිනේ. අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාවත් සම්බන්ධ කර ගන්න හිටවන කොට. එතකොට ඉවරයි. ගාමිණී මහත්තයාට කියන්න අදාළ ආයතනයට කතා කරලා වහාම මේක නවත්වන්න කියලා. අපේ තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය නැතුව කරන්න එපා කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හෙට යන වෙලාව දා ගන්නකෝ.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට දෙකට යන්නේ. කමිටුවේ කවුද ඉන්නේ. දැන් ෆිනෑන්ස් ඉඩම් ඉවරයි. දැන් ඊළඟට අනිත් කාරණය ඔබතුමන්ලා දන්නවා කපුහෙම්පල අශෝක කුලරත්නගේ ඉඩම. ඒක කමිටුවෙන් දීලා තිබුණා මම එන්න කලින්. සභාවට කලින්. ඒක ඒපාර අපි නැවැත්තුවානේ. නවත්වන්න හේතුව තමයි මේකේ නඩුවක් තියෙනවා කියලා. ඒ පාර නඩුව ඉවරයි කියලා ආවා. ඊට පස්සේ අපි දැම්මා අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ පැමිණිල්ලක් දාලා තියෙනවා කියලා. ඊට පස්සේ නැවත ආවා නඩු නිමිත්තක් නැහැයි කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නඩු නිමිත්තක් නැති වෙන්නේ කොහොමද, ආපු එක පෙන්වන්න නඩු නිමිත්තක් නැහැ කියලා. කිවුවනේ මම ඒක. වෙන පුද්ගලයෙකුට අයිතිය තියෙන කොට අන්සතු කරන්නේ කොහොමද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගාල්ල, කපුහෙම්පල, නන්දිමිත්‍ර විද්‍යාලයේ කොටසක් වංචා සහගත ලෙෂ අවසතු කිරීම (එච්.ඩබ්. ඉමේෂා මුතුමාල, කාන්තා පොලිස් අධිකාරි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 01.) තව කවුද කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගැනත් අපිට විශ්වාසයක් නැහැ නේ. ඒකත් කියන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ කාටද ඉතිං මේක කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිළිව ලියා ගන්න සභාවේදී මම ගෙනාවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීතිපතිත් කියනවා පවත්වා ගෙන යන්න බැහැ කියලා. මේ මතුවෙන ගැටළු. දැන් සභාව කොහොමද මේක නවත්වන්නේ.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පටලවා ගන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පටලවා ගන්නවා නෙමෙයි. මෙන්න වෙලා තියෙනවා. නඩුවක් පවරලා. දැන් නඩුව පවරලා තියෙනවා. උත්තරය මට කියන්නකෝ. මට එවලා තියෙනවා ඇපිල් කෝට් එකේ රෙජිස්ට්‍රාර්. මේ සභාවට විරුද්ධව නඩු පවරන්න භාර දීලා. මේකට දැන් කවුද යන්නේ. අපි මොනවද සභාව විදියට ඉදිරිපත් කරන්නේ. ඉහළ ඉඳන් ඔක්කොම අනුමැතිය දීගෙන දීගෙන ඇවිල්ලා තියෙනවා. ජනාධිපතිතුමත් දීලා. අගමැතිතුමත් දීලා. ඇමතිතුමත් දීලා. ප්‍රාදේශීය ලේකම් දීලා. එන්.බී.ආර්.ඕ. එක දීලා. අර මගුල් ඔක්කොගෙන්ම දීලා, ඔක්කොම කරගෙන ඇවිල්ලා. දැන් සභාවේ තීන්දු අරන් නවත්තන් හිටියා. අපි එක පාරක් ලියුම් දැම්මා නඩුවක් යනවා ඒක හින්දා දෙන්න බැහැ කියලා. මම ආවාට පස්සේ ඒක කරේ. ඒ පාර නඩුව ඉවර වුණා. නඩුවෙන් තීන්දුව දුන්නේ නඩුව පවත්වා ගෙන යන්න නඩු නිමිත්තක් නැහැ කියලා. ඊට පස්සේ ආයේමත් ඇපිල් එකක් දැම්මා. ඒකෙන් දුන්නෙත් ඒ තීන්දුවම. දෙකකින් එහෙම වුණා. මගෙන් නැවතත් අශෝක කුලරත්න ඉල්ලුවා. ඇයි නොදෙන්නේ කියලා නීතිඥයෝ හරහා ලෙටර් ඩිමාන්ඩ් දෙකක් එව්වා මිලියන ගාණක වන්දි ඉල්ලලා මගෙන්. ඊට පස්සේ ඒත් මම නවත්වාගෙන හිටියා. ඔබතුමන්ලා කිවුවනේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් යනවා කියලා. දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අර උත්තරය එවලා තියෙනවා මේක මෙතනින් එහාට පවත්වාගෙන යාමට විදියක් නැහැ කියලා. දැන් එතකොට මේකට දෙන උත්තරය මොකක්ද උසාවියට ගිහිල්ලා. සභාව විදියට දෙන උත්තරය මොකක්ද අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන්නම්. ඔබතුමයි අපියි අතරේ පටලැවිල්ලක් නෙමෙයි මේ. දැන් අදම කවුද යන්න එන්නේ මම දානවා පැමිණිල්ලක්. කවුද එන්නේ පැමිණිල්ලක් දාන්න යන්න. මොකද හේතුව මේ පරීක්ෂණය නිසියාකාරව කරලා නැහැ. ඔබතුමන්ලා අපි දෙගොල්ලෝ හිනා වෙන්න වැඩක් නැහැ. පරීක්ෂණය කරලා නැහැ හරියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා නීතිපතිත් කියනවා පවත්වා ගෙන යන්න ඕන නැහැ කියලා. දැන් මෙතෙක් අපි කිවුවේ නීතිපතිට දැම්මා ඒකේ උත්තර නැහැ කියලානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙහෙම තියෙන්නේ සභාපතිතුමා. නීතිපතිට දාන්න පරීක්ෂණය කරපු මිනිස්සු හරියට කරාද කියලා කවුද දන්නේ. පොලීසියෙන් පරීක්ෂණයක් කරාම ඒක හරියි කියලද කියන්නේ. එහෙම වෙච්ච ඒවා නැහැනේ. එහෙම නැති ඒවා කොච්චර තියෙනවද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආයතනවලට අභියෝග කර කර එහෙම කොහොමද යන්නේ. අපි අධිකරණයේ නඩුවක් දානවා. ඒකෙනුත් පරාද වෙනවා. පවත්වා ගෙන යන්න බැහැයි කියලා නඩුව අයින් කරනවා. එතකොට දැන් කියන්නේ අධිකරණයත් හරි නැහැ කියලා. බලන්නකෝ. ඊට පස්සේ අපි දානවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. එතනින් දෙන්න කියලා. එතකොට ඒකෙන් එවන්නේ මේක පවත්වා ගෙන යන්න විදියක් නැහැ කියලා. එතකොට ඒකත් හරි නැහැ. අපි කාගේ ළඟටද මේ යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම අපි මේක ඇතුලේ රණ්ඩු සරුවල් වෙන මට්ටමට මේක ගෙනිහිල්ලා වැඩක් නැහැ. මේක බේරගන්න පුලුවන් අදාළ නිශ්චිත ආයතනත් එක්ක, ඒ කියන්නේ, නීත්‍යානුකූලව ගනුදෙනු කරන්න සුදුසුකම් අපි සම්පූර්ණ කරලා තියෙන්න එපැයි. පළවෙනි කාරණය තමයි අපි පෞද්ගලිකව හරි නඩුවක් දාන කොට නඩුවට අදාල සියලු නිමිති අපි තමයි හොයා ගන්න ඕන. එතකොට නඩුවේ පදනමක් තියෙනවද කියලා අපි තහවුරු කර ගන්න ඕන. නිකමට ගිහින් එල්ලිලා වැඩක් නැහැ හැමදේකටම. ඒ නිසා ඒක හරියට අධ්‍යයනය කරනවා නම් හරි. සාමාන්‍යයෙන් නීතිය කරලා නැති වුණාට, විශ්ව විද්‍යාලයට ගිහින් නැති වුණාට, සාමාන්‍ය අවබෝධයක් අපි කාටත් තියෙනවානේ. සාමාන්‍ය ජීවිතයේ තීන්දු තීරණ ගන්න විදියක් තියෙනවානේ. එතකොට ඇත්තටම මේක රාජ්‍ය දේපලක් කියලා තහවුරු කරගෙන නඩුවකට ගිහින් මේක ජයග්‍රහණය කරන්න පුලුවන් පදනමක් මේකට තියෙනවද කියලා අපි අවබෝධ කර ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වෙන්නේ ඒක නෙමෙයිනේ. දැන් ඕකේ නඩුවට ගිහින් අපිට යන්න විදියක් නැහැනේ. ඒ පාර කියන්නේ දිල්රුක් සභාපති මේක පරාද කරා කියලා. ඕක සභාව විසින් පරාද කර ගත්තා. ඔන්න ඕකයි වෙන්නේ. මේවාට යන නඩු වියදම අපරාදේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි මම කිවුවේ අවබෝධ කර ගන්න ඕන කියලා. අපි ඒකේ පඹගාල වගේ පැටලිලා ඉවර වෙලා මේක ලිහා ගන්න බැරුව ඉන්න එක ඊට පස්සේ වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ මෙච්චරයි. දැන් මම අහන්නේ මෙච්චරයි. මේකට අපි දෙන උත්තරය කියන්නකෝ අධිකරණයේදී. ඒකනේ වෙන්න ඕන. දැන් මේ ඇපිල් කෝට් එකේ රෙජිස්ට්‍රාර් එවලා තියෙනවා. නඩු පැවරීමට භාර දීලා තියෙන්නේ. දැන් අපිට එතනින් එහාට යන්න බැහැනේ. දැන් අපි නීතිඥ කෙනෙක්ව අල්ලන්න වෙනවා. දැන් අපි දෙන උත්තරය මට කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට විරුද්ධවද නඩු දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම අපි වහාම හොයා ගන්න ඕන. මේකට විරුද්ධ වෙච්ච පදනම් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පදනම් මොනවාද, විරුද්ධ වෙන පදනම් ටික මට කියන්න වෙන වෙනම. මෙන්න මේ අංකය යටතේ නඩුවක් තියෙනවා කියලා අපි විරුද්ධ වුණා මුලින්. ඒ නඩුව ඉවර වුණාම සලකා බලනවා කිවුවා. එතකොට ඒ නඩුව පවත්වා ගෙන යාමට නිමිත්තක් නැහැ කියලා නඩුව අයින් කරා. ඒ පාර දැම්මා ඇපිල් කෝට් එකේ. ඒ පාර ඒකත් අයින් කරා. ඒ පාර මම දැම්මා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මේකට විමර්ශනයක් යනවා. ඒක ඉවර වෙනකම් දෙන්න බැහැ කියලා කිවුවා. ඒ පාර ඒකෙනුත් දැන් එවලා තියෙනවා නඩුව පවත්වා ගෙන යාමට නඩු නිමිත්තක් නැහැ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි ඒ වටෙන්ම හිර වෙලානේ දැන් තියෙන්නේ. අපිට තව එකකට පවරලා, ඒක බැරියර් එකකට දා ගෙන එහෙම දිගට යන්න බැහැ. කොහොම ගියත් අපි අවසානයේ අවබෝධ කර ගන්න වෙනවා මේකේ ඇත්තටම වැරැද්දක් තියෙනවද කියලා. ඒක අපි තර්ක කරන්න එපැයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකේ ඔබතුමා දකින වැරැද්දක් තියෙනවද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි දකින විදිය නෙමෙයි වැදගත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අවසතු වෙච්ච කාරණය සම්බන්ධව අපිට ප්‍රශ්නයක් තියෙනවා. ඒක බරපතල වංචාවක්. ඒක ආයේ කතා කරන්න දෙයක් නැහැ. මොන ක්‍රමයෙන් හරි බරපතල වංචාවක් ඒක. නමුත් ඒක මොන ක්‍රමයෙන් හරි වෙලා තියෙනවා. වෙලා ඒ මිනිහට ඉඩම ගිහිල්ලා තියෙනවානේ. අවසතු වෙලානේ මේක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අවසතු කරපු ආකාරය සම්බන්ධව අපිට ප්‍රශ්නයක් තියෙනවානම් ඒක අපිට තහවුරු කරන්න පුලුවන් සාධක තියෙන්න ඕන. ආයතන වලට පවරලා විතරක් වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒවාට තමයි දැම්මේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නීතිපතිට දැම්මෙ ඒකට. ඒවායින් මෙහෙම එනවා නම් අපි මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පාර්ලිමේන්තුවෙත් කතා වුණා මේක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සම්බන්ධව අපිට කවුරුහරි ඉන්නවානේ තොරතුරු ඉදිරිපත් කරන. ඔබතුමාගේ හරි අබේසේකර මන්ත්‍රීතුමාගේ හරි පෞද්ගලික වුවමනාවකට නෙමෙයිනේ මේක යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට අමතරව විෂය භාර ඇමතිතුමා වන ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමා බොහොම ඍජුවම කියනවා ඔබතුමා මොන බලයෙන්ද මේක තියාගෙන ඉන්නේ කියලා. මේක ලේසී කාරණයක් නෙමෙයි. ලියුම තියෙනවා මම පෙන්වන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට එහෙම තියාගෙන ඉන්න බැහැ. ලිඛිතව ඒ මිනිස්සුන්ට යම් යම් තැන් වලින් අවසරය ලබා දීලා තියෙද්දි අපිට බලහත්කාරකම් කරන්න බැහැ කාටවත්. හැබැයි බලහත්කාරකම් කරන එක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ. අපිට ඒ සිද්ධියේ මූලාරම්භයේ වෙච්ච අකටයුත්තක්, අවභාවිතයක් තියෙනවානම් ඒකට අපි කරුණු හොයා ගන්න පුලුවන් නම් ඒක ඉස්මතු කර ගන්න. ඒක වෙන කාරණාවක්. නැත්නම් දිගින් දිගට නිස්කාරණයේ විරුද්ධ වෙන එකට අපි හැල්ලු වෙනවා. සභාවක් හැටියට හැල්ලු වෙනවා. ඒකට නිකං ආවාට ගියාට විරුද්ධ වෙන එක සාධාරණ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මම නම් දකින්නේ අධිකරණයට ගිහිල්ලා කියන්න තියෙන්නේ අපේ විරෝධතාවයක් නැහැ ස්වාමීනි කියලා විතරයි. මේකේ වෙන මොකක්ද කියන්නේ. මොකක්ද අපිට දැන් නොදෙන්න තියෙන හේතුව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔතනට ගියාම වෙන්නේ සියලුම දේ නීත්‍යානුකූල නම් අපිට විරුද්ධ වෙන්න බැහැ. ප්‍රශ්නය තියෙන්නේ ඔබතුමාගේත්, මගේත්, මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ගේ හෘද සාක්ෂිය දන්නවා නම් මේකේ මූලාරම්භයේ ප්‍රශ්නයක් තිබුණා කියලා. ඇත්තටම මේක මහජන දේපලක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි ඉන්දික මන්ත්‍රීතුමා. මේක වංචාවක්, මංකොල්ලයක්. ඒක ආයේ කතා කරන්න දෙයක් නැහැ. නමුත් උපක්‍රමශීලිව ඒක නීත්‍යානුකූලව කරගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට ඒ නීත්‍යානුකූලව කර ගනිපු විදිය වංචා සහගතයි කියලා ඔප්පු කරන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැම්මේ. ඒ අය නීතිපතිට දාලා තියෙනවා. එතකොට නීතිපති නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දාලා තියෙනවා මේකේ පවත්වා ගෙන යාමට නඩු නිමිත්තක් නැහැ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අතනින් ආපස්සට හොයලා වැඩක් නැහැ. ඒක හොරාගේ අම්මාගෙන් පේන අහනවා වගේ වැඩක්නේ. එයාලා දීපු තීන්දුවක් එයාලා විසින්ම තනියම වෙනස් කර ගන්නේ නැහැනේ. අපි ඊට විරුද්ධව බරපතල මතයක්, බරපතල සාක්ෂියක් ගොඩනගලා ඒක තහවුරු කරන්න පුලුවන්නම් විතරයිනේ යන්න පුලුවන්. එහෙම බැරිනම් බැහැ. ඔබතුමත්, මමත්, මේ ඉන්න මන්ත්‍රීවරු සියලුදෙනාමත් ඊට අමතරව ඒ ප්‍රදේශවාසී ජනතාවත් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් යම් අවබෝධයක ඉන්නවා. මේක සම්බන්ධව ඒ මිනිස්සුත් සූදානම් නම් අපිට උපකාර කරන්න නැත්නම් අපිට යන්න බැහැ. ඒ මිනිස්සුන්ට අවංක වුවමනාව තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. සභාව විදියට උදවු කරන්න. දැනටත් මම ඉන්නේ මේක නොදෙනවයි කියන මතයේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා දැනුත් මතුකරපු කාරණය ඒකනේ. ඔබතුමාත්, මමත් හරියට දන්නවා කිවුවා මේකේ ප්‍රශ්නය. ඔබතුමාගේ හෘද සාක්ෂියේ එකඟතාවය තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම. මෙතන ඉන්න දන්න අය දන්නවා. මෙතන මංකොල්ලයක් කරේ. ඒක හින්දා තමයි අපි මේක නවත්වාගෙන හිටියේ. දැන් මෙහෙම කරන්නම්. අපි ජනාධිපති නීතිඥ කෙනෙකුට මේ ලිපිගොනුව දීලා නැවත අධ්‍යයනය කරවන්නම්. කරවලා මේක පවත්වා ගෙන යාමට පුලුවන්නම් අපි භාර දෙමු. හැබැයි ඉතිං රුපියල් ලක්ෂ පහක විතර ලොකු ගාණක් දෙන්න වේවි මේකටත්. එහෙම නැත්නම් අපි මේක කරනවා කියන එකඟතාවයට එන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ ලක්ෂ පහක් දුන්නත් වැඩේට යම් සාධාරණ තොරතුරක්, යන්න ඕන එකක් තියෙනවා නම් ඒක පාඩුවක් නැහැ. මේක මේ රටේ දේපලක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. නමුත් ඒකට යාමෙත් හේතු දෙකක් තියෙනවා. ඒ ලක්ෂ පහත් නැති වෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි යන්න කලින් ඉක්මනින් තහවුරු කර ගන්න ඕන මේ වැඩේ. නිශ්චිත තහවුරුවක් තියෙන්න ඕන අපිට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා බලන්න මේක කරන්න පුලුවන්ද කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැත්නම් යන්නම් වාලේ අපි නිකං පැටලිලා වැඩක් නැහැ. පැටලෙන්න නෙමෙයි ඕන. ඔබතුමාට, මට වඩා ඒ ඉතිහාසය තුළ සිදු වෙච්ච සිදුවීම් ගැන අවබෝධයක් තියෙනවානේ. මැදිහත්වීමකුත් සිදු කරලා තියෙනවානේ. අපිත් මැදිහත්වීම කරලා තියෙනවා. මම කියන්නේ ඒ නිසා අපි එකතු වෙලා සභාවක් හැටියට මේක රැකගමු. මේක අපේ දේපලක්. අපිට සම්පතක්. අපේ ප්‍රදේශයේ පාසලක් කියන්නේ අපිට සම්පතක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක විගණනය කරන්න කෝප් කමිටුවට දාන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක සම්බන්ධව ඉක්මනින් පියවරක් ගනිමු. අපි මේක සම්බන්ධව තැන් තැන් වල ඉඳගෙන විවේචනය කරලා වැඩක් නැහැ. අපි එක එක්කෙනාව විවේචනය කරලා වැඩකුත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ බලන්න. මේකට චමල් රාජපක්ෂ ඇමතිතුමත් එවලා තියෙනවා. ඊට පස්සේ ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමත් එවලා තියෙනවා.

අසාධාරණයක් පිළිබඳව දැනුම්දීම (ජනක බණ්ඩාර තෙන්නකෝන්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.)

ඊළඟට මේ ආණ්ඩුකාරවරයත් එවලා තියෙනවා. ඊට පස්සේ ලෙටර් ඩිමාන්ඩ් එවලා තියෙනවා කාංචනා එස්. කාරියවසම් නීතිඥතුමිය. මේක කෙලින්ම මගේ නමට එවන්නේ.

ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර අංක BP/SD 2018/18 සම්බන්ධ එන්තරවාසියයි. (කාංචනා එස් එස්. කාරියවසම්, නීතිඥ, අංක 08, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඇමතිවරු හෝ ආයතන හෝ අපිව දැනුවත් කිරීම් කරන්නේ එයාලා දෙන තොරතුරු මත පදනම්ව නේ. මේ පුද්ගලයාගේ තොරතුරු මත පදනම්ව තමයි එයාලා ලියුම් එවන්නේ. ඒ තොරතුරු වලට සම්බන්ධ නෛතික ලියකියවිලිත් එයා සතුව තියෙනවා. ඒක තහවුරු කරන්න ඕනනේ. හැබැයි ඒ නෛතික ලියකියවිලි හදා ගෙන ඔක්කොම. පහුගිය කාලයේ භුක්ති විඳපු, පාසලක් විදියට පවත්වා ගෙන ගියපු, රජය විසින් නඩත්තු කරපු දේපලක් පවරා ගැනීමට අවශ්‍ය ලිපිලේඛන හදා ගෙනනේ. අපි තර්ක කරන්නේ ඒක නෙමෙයිනේ. අපි තර්ක කරන්නේ මෙතන එයාට අයිතියක් නැහැ. මේක රජයට පවරලා රජය විසින් නඩත්තු කරා කියන එක. එයා ළඟ පෞද්ගලික අයිතිය තියෙන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම අයිතියක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. අපි ඒක කතා කරලා වැඩක් නැහැ. මේක කොහොමත් අධිකරණයට යන එකක්. එතනදී නීතිඥයෝ හම්බ වෙලා මේක බේර ගන්න විදියක් බලමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් කොහොමත් අධිකරණයට යන්න වෙනවානේ. අපිට පුලුවන්ද අපේ පැත්තෙන් තහවුරු කර ගන්න අපි කියන එක නිවැරදියි කියලා. අන්න ඒකටයි උත්සාහ කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ගිහින් බලමු. ඒක සම්බන්ධව වෙනම කතා කරමු. හෙට හවසට කතා කරමු ඒකත්. ඊළඟට හෙට හවස දෙකට අපි තියෙන ඒවා හය, හත වෙනකම් හරි ගිහිල්ලා ප්‍රශ්නය ඉවර කරමු.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව එනකම් බලාගෙන හිටියේ. දැන් අනවසර ඉදිකිරීම් ගැන කතා කරනවා. හැබැයි අපි මහජන නියෝජිතවරයෙක් විදියට ප්‍රදේශයේ අනවසර ඉදිකිරීමක් වෙනවානම් මේ සභාවට ඒක දැනුම් දෙන්න විදියක් නැහැ. එහෙම වුණාට පස්සේ මොකද වෙන්නේ අපේ නමත් එක්ක තමයි මේ ගෙදර අය දැනුවත් වෙන්නේ. මම මේ සභාවේ කතා කරපු අනවසර ඉදිකිරීම් සම්බන්ධව පිටපතක් මට දැන් එවලා තියෙනවා. එවලා විතරක් නෙමෙයි උප කාර්යාලයට ගිහිල්ලා මේ ගැන විමසුවට පස්සේ ඒ මිනිස්සුන්ට කියලා තියෙන්නේ චනක මන්ත්‍රීතුමා තමයි පෙත්සම ගහලා තියෙන්නේ කියලා. කලුපාට පෑනෙන් ලියලා දීලා තියෙන්නේ, මෙන්න කියලා ලියුමත් පෙන්වලා. දිනූෂ මහත්තයයි, ඒකේ ප්‍රධානියයි ඒක පෙන්වලා තමයි කියලා තියෙන්නේ. මෙන්න චනක මන්ත්‍රීතුමා තමයි පෙත්සම ගහලා තියෙන්නේ කියලා. එතකොට අපිට තියෙන ගරුත්වය මොකක්ද. අපි වැරැද්දක් මේ කතා කරන්නේ. අපි පක්ෂ පාට බලලා නෙමෙයි දේශපාලනය කරේ. නිලධාරීන්ට දේශපාලනය තියෙන්න පුලුවන්. මගේ මේ දේශපාලනයේදී පක්ෂ පාට කතා කරේ නැහැ. මම වැරැද්ද කතා කරේ. මම මේ සභාවෙන් යනකොට අනවසර ඉදිකිරීමක් කරනවා නම් ඒවාට කතා කරන්නේ කොහොමද දැන්. මොකද අනිත් පැත්තෙන් ගිහින් කියනවා. මම හිතන්නේ සල්ලි වලටද දන්නේ නැහැ. මේක මම අවුරුදු ගාණක් සභාවේදී කතා කරා. 2020-09-15 තමයි මේ ලියුම ගිහිල්ලා තියෙන්නේ. මම දැන් සභාවෙන් ඉල්ලනවා. සභාපතිතුමාට මේ වාර්තාව ගේන්න කියලා. මේ ලියුමේ තියෙනවා උක්ත කරුණට අදාළව අපේ තාක්ෂණ නිලධාරි ස්ථානීය පරීක්ෂණයක් සිදුකර එම ඉඩමේ අයිතිය ඔබට නැති බවත්, මායිම් ගල් පරීක්ෂා කිරීමේදී මාර්ගය අල්ලාගෙන නොමැති බවටත් වාර්තා කර ඇති බව කියලා. කෝ ඒ වාර්තාව. දැන් සභාපතිතුමාට එවපු වාර්තාව මම ඉල්ලනවා. ඒ වාර්තාව ගේන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සභාවට ගේන්න විදියක් නැහැ. ඒක උප කාර්යාලයේ තියෙන්නේ. ලබන සභාවට ගේන්නම් ඒක.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒකේ තියෙන මායිම් ගල් පිළිබඳව කොහාමද ඒ වාර්තාව ගත්තේ. පරීක්ෂණය කරේ කොහොමද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන අඩුපාඩුවක් තියෙනවා. ඒක මම පිළිගන්නවා. අඩුපාඩුවක් තියෙනවා. මින් ඉදිරියට ඒක වෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මින් ඉදිරියට ඒක වෙන්න බැහැ. මින් ඉදිරියට මේ තාක්ෂණ නිලධාරි මගේ කොට්ඨාශයට එවන්නත් එපා. මට දාන්න එපා මේ තාක්ෂණ නිලධාරිව. මම ඔබතුමාට කියලා ඇති. මේ සභාවේ කතා කරලත් ඇති. මේ දිනූෂ මහත්තයා එක්ක මට වැඩ කරන්න බැහැ. මට එපා මේ තාක්ෂණ නිලධාරි. මේ සභාවේ මම පෙරලියක් කරනවා මේක. මට ඕන නැහැ. මට මෙයත් එක්ක වැඩ කරන්න බැහැ. මාගේ කොට්ඨාශයට මෙයාව දෙන්න එපා. අපිව පාවා දුන්නම කොහොමද ගමේ ගිහිල්ලා වැඩ කරන්නේ. මම විනය පරීක්ෂණයක් ඉල්ලනවා. මේ වෙනුවෙන් විනය පරීක්ෂණයක් කරන්න ඕන සභාවෙන්. ලියුම පෙන්වලා තිබුණා. කලුපාට පෑනෙන් ලියලා අත්සන් කරපු ලියුම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගෙත් ඔතන අඩුපාඩුවක් තියෙනවා. මම නිලධාරි ගැන විශ්වාසය තියලා ලියුම් වලට අත්සන් කරනවා. ඒක හින්දා මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ඉස්සෙල්ලම ආරක්ෂා කරන්න ඕන. ඕකට පිටපත මන්ත්‍රීවරුන්ට දැම්මට පස්සේ ඒ මනුස්සයා ගමේ ගිහින් ඉවරයි. අනවසර ඉදිකිරීමක් ඉවත් කරන්න යවන එකට ඇයි මන්ත්‍රීවරුන්ගේ නම් දාලා පිටපත දාන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේ බලන්න පිටපත කියලා යටින් දාලා තියෙනවා චනක මන්ත්‍රීතුමාට කියලා. මොකක්ද මේ කතන්දරය. පිටපත යවලා තියෙනවා. ඔබතුමන්ලාටත් වෙන්න පුලුවන් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා මේ ගැටලුව සමබන්ධව නිලධාරීන්ට සභාව දැනුවත් කිරීම සඳහා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව.</u>

කාරක සභා අවස්ථාවේදී කළමනාකරණ සහකාර රෂෝමා පර්ලි මහත්මිය පහත අදහස් දක්වා සිටින ලදී.

- චනක චමල් පද්මකුමාර මන්ත්‍රීතුමාගේ ලිපියට අදාළව ක්‍රියාමාර්ග ගැනිමේදී යවන ලද ලිපියේ පිටපතක් මන්ත්‍රීතුමාගේ දැනගැනීම පිණිස යොමුකළ බව.

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- අදාළ පුද්ගලයා අනවසරයෙන් එම ඉඩමේ පදිංචිවී සිටින බවත්, ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මේ ගැන දැනුවත් කරන ලෙස දැනුම් දුන් බව.
- ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකරන විට මේ ගැන විමසූ විට සභාවට ලැබුණු පැමිණිල්ලක් අනුව පැමිණි බවට දැනුම් දුන් බව.

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ලිපියක් ඉදිරිපත් වූ විට ඒ සඳහා ක්‍රියාමාර්ග ගත් බවට දැනුම් දීමේ පදනම මත පිටපත චනක චමල් පද්මකුමාර මන්ත්‍රීවරයා වෙත යොමුකර ඇති බව.
- සභාවේ සාකච්ඡා කරන දේ පිළිබඳව සභා වාර්තාවේ අන්තර්ගතව ඇති බවත්, සභා වාර්තා පුස්තකාල දෙකෙහි සහ සභාවේ වෙබ් පිටුවේ ඇති බව.
- මෙම සිදුවීමේදී උලුප්පා දක්වා තිබීම වැරදි බවත්, බල ප්‍රදේශයේ වරදක් සිදුවන විට එය පෙන්වාදීම මන්ත්‍රීවරයෙකුට සිදුකල හැකි බව.

- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම ඉල්ලීමක් කරනවා මගේ කොට්ඨාශයට එවන්න එපා මේ තාක්ෂණ නිලධාරිව. මම නෙමෙයි ගමේ මිනිස්සු ගහවිද දන්නේ නැහැ. මට වෙන තාක්ෂණ නිලධාරි කෙනෙක්ව දෙන්න.

ගරු සභාපතිතුමා මේ අනවසර ඉදිකිරීමට සල්ලි ගන්න ඕන. ඒකට ලියුමක් ගහලා වැඩක් නැහැ. ඒ අනවසර ඉදිකිරීමට සල්ලි ගන්න ඕන. ඒ බැම්මට සල්ලි ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයිතිය එයාට නැතිලුනේ. ප්‍රාදේශීය ලේකම්ටත් යවලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අයිති නැත්නම් ලියුමක් ගැහුවේ ඇයි අයිති නැති කෙනෙකුට. අයිතියක් නැත්නම් ලියුමක් යැවුවේ මොකද කියන්නකෝ. අයිතියක් නැති මිනිහෙකුට ලිපිනයක් තියෙන්න බැහැනේ. එහෙම නම් ඕන ඕන විදියට ලියුම් ගහන්න පුලුවන්නේ. එහෙම කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේකත් ක්ෂණිකව විසඳිය යුතු ප්‍රශ්නයක්. මොකද හේතුව ඊපීස් ඉලේපෙරුම මාවතේ යූ.පී පියසේන මහතා ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. බොහොම විධිමත්ව ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරලා තියෙනවා. ඒ හින්දා මේක බැලුවට පස්සේ ඇත්තටම මේ ප්‍රශ්නය ඇති කර ගනිපු එකක් ගිහිල්ලා දාලා ඉවර වෙලා. ඉතින් ඒක හින්දා දැන් බැලුවම ඒ මිනිස්සු වතුරට ඊයේ පෙරේදා සම්පූර්ණයෙන්ම යටවෙලා. ඉතින් මේකට ඇත්තටම අපි කවුරුත් සාමූහිකව ගිහිල්ලා ඉවරවෙලා බලලා විසඳුමකට යන්න බලන්න හෙට දවසේ හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මම පරීක්ෂණයක් කරා අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් බලන්න යටවෙලානේ එහෙමම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් ඒකේ ප්‍රධාන කාරණය තියෙන්නේ ඕක නෙමෙයි. මීටර් විස්සක් විතර සම්පූර්ණ පාරේ කොන, පාරේ අවසානය මේ පැත්තේ ඉඩමේ කෙනා අල්ලගෙන. ළිඳකුත් තියෙන්නේ පාරේ සම්පූර්ණයෙන්ම. ඉස්සෙල්ලා ඒ ප්‍රශ්නය විසඳන්න ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සභාපතිතුමා එතන තියෙන්නේ ඉඩම් දෙකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉඩම් දෙකක් වුණාට ප්ලෑන් එකේ පෙන්වනවා අන්තිමට යනකම් පාර.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ප්ලෑන් එකේ ඔක්කොම තියෙනවා. ඒ දෙකක්. ඒ නිසා මේක අපි පෙන්වලා කවුරුවත් ඉන්න තැන කතා කරමු. මේක දාන්න ඕන දිගට යන්න. මොකද දන්නවද යටවෙනවා ඇත්තටම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මනුස්සයත් පිළිගන්නවා තමන් වහ ගත්තා කියලා. තව මොනවද කියන්නේ. ඔය කියන මිනිහම, ළිඳ තියෙන මනුස්සයාම කියනවානේ ඒක මෙතනට අදාළ කාරණාවක් නෙමෙයි. ඔව් මම ඉස්සර වහගත්තා. මේක මෙතනට අදාළ කාරණාවක් නෙමෙයි කියලා. ඒක මෙතනට අදාළ කාරණාවක් තමයි. එයත් වහගෙන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** යටවෙන්නේ ඒක හින්දා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් ඒකත් බේරන්න එපැයි අපි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ළිඳ කාගෙද කියලා එකක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. සියලුදෙනාටම බොහොම ස්තුතියි.

- **විශේෂ මහා සභා රැස්වීමේ වැඩ කටයුතු මෙයින් අවසන් කරන ලදී.**

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.